වාර්ෂික වාර්තාව - 2014
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

ஆண்டறிக்கை - 2014
ஊவா வெல்லஸ்ஸ பல்கலைக்கழகம்

Annual Report - 2014
Uva Wellassa University

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
පස්සර පාර
බදුල්ල

Uva Wellassa University
Passara Road
Badulla

ஊவா வெல்லஸ்ஸ பல்கலைக்கழகம்
பசறை வீதி
பதுளை

Uva Wellassa University

වාර්ෂික වාර්තාව - 2014

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

අන්තර්ගතය

01. අපගේ දැක්ම 01

02 අපගේ මෙහෙවර 01

03. උප කුලපතිතුමාගේ පණිවුඩය 02

04. මානව සම්පත් හා ශිෂ්‍ය - ශිෂ්‍යාවෝ 05

05. ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ගේ බඳවා ගැනිම පිළිබඳ විස්තර 06

06. අධ්‍යයන කාර්ය මණ්ඩලය 09

06.1 2014 වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර 09

06.2 පුස්තකාල කාර්ය මණ්ඩලය 10

07. පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය 10

07.1 පරිපාලන කාර්ය මණ්ඩලය 10

07.2 අනධ්‍යයන කාර්ය මණ්ඩලය 11

07.3 අනධ්‍යයන කාර්ය මණ්ඩලය බෙදි ගොස් ඇති ආකාරය 12

08. පර්යේෂණ, නව්‍යකරණ හා ප්‍රකාශන 13

09. වැඩසටහන් , සම්මන්ත්‍රණ හා වැඩමුළු 13

10. ලැබුණු සම්මාන ප්‍රදානයන් පිළිබඳ විස්තර 13

11. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර 14

12. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර 14

13. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සම්පාදිත) 14

14. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සම්පාදිත) 15

15. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම) 15

16. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම) 15

17. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2014 16

18. 2014 වර්ෂයේ දී ලැබුණු යටිතල පහසුකම් පිළිබඳ විස්තර 16

19. 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 17

20. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය 18

21. 2014 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය 19

22. විගණකාධිපති වාර්තාව 20

23. විගණකාධිපති වාර්තාවට පිළිතුරු 34

Uva Wellassa University

1. අපගේ දැක්ම

සෞභාග්‍යය හා යහපැවැත්ම සාක්ෂාත් කර ගනු පිණිස පිබිද එන කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍ර තුළ දැනුම, තාක්ෂණයන්, තිරසාර නිෂ්පාදන පිළිවෙත් හා ක්‍රියාවලීන්, ව්‍යවසායකත්වය, තිරසාර කළමනාකරණ පිළිවෙත් හා ක්‍රියාවලීන් යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම නිර්මාණය කිරීම හා ප්‍රචලිත කිරීම හරහා ජාතික සම්පත්වලට අගය එක් කිරීම සඳහා වූ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් බවට පත් වීම.

2. අපගේ මෙහෙවර

ආර්ථික ක්‍රියාකාරිත්වයට අගය එක් කිරීම මඟින් ජාතික සංවර්ධනයට සුවිශේෂී දායකත්වයන් ලබා දීම පිණිස උචිත දැනුමෙන්, අත්‍යවශ්‍ය කුසලතාවලින්, ව්‍යවසායකත්ව හැකියාවන්ගෙන්, සාරධර්මවලින් හා ආකල්පයන් ගෙන් හෙබි සැමතින් පරිපූර්ණ හා පූර්ණ වශයෙන් රැකියා නියුක්ත කළ හැකි තාක්ෂණතාන්ත්‍රික හා ව්‍යවසායික උපාධිධාරීන් බිහි කිරීම

3. උප කුලපතිතුමාගේ පණිවුඩය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ 14 වැනි විශ්වවිද්‍යාලය වශයෙන් 2005 ජූනි 01 දින ස්ථාපිත කරනු ලැබීය. එය රටෙහි ආර්ථික සංවර්ධනයේ අවශ්‍යතා සපුරාලනු පිණිස සහසම්බන්ධ වූ විශ්වවිද්‍යාලයක් ගොඩනැගීමේ සුවිශේෂී අත්හදාබැලීමක් වශයෙන් සැලකේ. ඒ අනුව එය නූතන අධ්‍යාපනික සංකල්පයන් සහිත, සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල පද්ධතියෙන් වෙනස් - ව්‍යවසායික කුසලතා හා නිපුණතාව සහිත උපාධිධාරීන් බිහි කිරීම අරමුණු කර ගත් - විශ්වවිද්‍යාලයකි.

ජාතික සංවර්ධනය උදෙසා සඵලදායී ක්‍රියාමාර්ග ඉල්ලා සිටින සමාජයට අපගේ තරුණ ව්‍යාවසායකයින් මුහුණ දෙන අවස්ථාව වන විට විශේෂඥයින් වී සිටිය හැකි වන අයුරින් වඩාත්ම යහපත් මෙවලම්වලින් අපි ඔවුන් සන්නද්ධ කරමු. ඔවුහු මෙම සංකල්පයේ ඵලය සහ ශ්‍රී ලාංකික උසස් අධ්‍යාපන පද්ධතියේ නව අත්හදා බැලීමෙහි සාර්ථක අවසන් නිෂ්පාදනය වෙති. අපට එම අත්හදා බැලීමෙහි ප්‍රතිඵලය සැබැවින්ම ඇගැයීමට ලක් කළ හැක්කේ එය ස්ථාපනය කොට වසර කීපයක් ගතව ඇති වර්තමානයේදී ය.

ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි, විශේෂ උපාධි සහ ව්‍යාපාර ආයතනික මෙන්ම අඛණ්ඩ අධ්‍යාපන වෙළඳපලවල් තුළ ආර්ථික සංවර්ධනය සඳහා විද්‍යාත්මක, තාක්ෂණික හා ව්‍යවසායික ප්‍රවේශයන් භාවිතා කිරීමෙහි සමත් පරිපූර්ණ නායකයින් බිහි කිරීම සඳහා දේශීය සම්පත් සමුදායට අගය එකතු කිරීම කෙරෙහි දැඩි අවධාරණයක්ද සහිතව පර්යේෂණය හා ඉගෙනීම කෙරෙහි මෙම විශ්වවිද්‍යාලය අවධානය යොමු කරයි.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය මනරම් දර්ශනයකින් යුතු බදුල්ලේ කඳුකර ස්ථානයක පිහිටි අක්කර 59 ක් පුරා පැතිර පිහිටයි.

ක්‍රියාකාරිත්ව සැලැස්ම සමග 2013-2018 කාලපරිච්ඡේදය සඳහා පිළියෙළ කරන ලද සංයුක්ත සැලැස්මේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. වර්ෂය මුළුල්ලේම සංයුක්ත සැලැස්ම සමාලෝචනය/නිරීක්ෂණය කිරීම පිණිස ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම විශ්වවිද්‍යාලයේ මුඛ්‍ය අරමුණු සාක්ෂාත් කර ගනු පිණිස සංවර්ධනය කරන ලද පහත මුඛ්‍ය ක්ෂේත්‍රයන් ආයතනික සැලැස්ම තුළ හඳුනා ගෙන ඇත:-

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයෙහි පීඨ තුනක් ඇත. ඒවා නම්:-

1. සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය
2. විද්‍යා හා තාක්ෂණවේද පීඨය
3. කළමනාකරණ පීඨය

මෙම විශ්වවිද්‍යාලය පහත සඳහන් උපාධි වැඩසටහන් ඉදිරිපත් කරයි:-

1) සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය	I. සත්ව විද්‍යා II. අපනයන කෘෂිකර්ම III. තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම IV. ජලජ සම්පත් තාක්ෂණවේදය V. තාල හා ක්ෂීර තාක්ෂණවේදය සහ අගය එක් කිරීම
2) විද්‍යා හා තාක්ෂණවේද පීඨය	I. විද්‍යා හා තාක්ෂණවේදය II. පරිගණක විද්‍යාව හා තාක්ෂණවේදය III. කර්මාන්ත තොරතුරු තාක්ෂණවේදය IV. ඛනිජ සම්පත් හා තාක්ෂණවේදය

3) කළමනාකරණ පීඨය

I. ව්‍යවසායකත්ව හා කළමනාකරණ අධ්‍යයනය
II. ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය

ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ සන්නිවේදන කුසලතා සංවර්ධනය කරනු පිණිස අනිවාර්ය වැඩසටහන් ක්‍රියාත්මක වේ. මෙහි උපාධි වැඩසටහන් තනි දෙපාර්තමේන්තු විසින් පිරිනමනු ලබන විෂයන්ට/පාඨමාලා මොඩියුලවලට සීමා නොවේ.

ක්‍රියාකාරීත්ව සැලැස්මට සමාන්තරව, 2013-2018 සඳහා වූ සංයුක්ත සැලැස්මේ ප්‍රගතිය පිළිබඳව ද විශේෂ අවධානය යොමු කර ඇති බව පවසනු කැමැත්තෙමි. වර්ෂය පුරාම සංයුතත්ත සැලැස්ම සමාලෝචනය/නිරීක්ෂණය කරනු පිණිස ක්‍රියාමාර්ග ගෙන ඇත. විශ්වවිද්‍යාලයෙහි මුඛ්‍ය අරමුණු සාක්ෂාත් කර ගනු පිණිස සංවර්ධනය කළ යුතු ක්ෂෙත්‍රයන් ලෙස සංයුක්ත සැලැස්ම මගින් පහත ප්‍රධාන ක්ෂෙත්‍රයන් හඳුනා ගෙන ඇත.

- ජාතික හා ගෝලීය අදාළත්වයක් සහිත විවිධ ක්ෂේත්‍රයන්හි ගුණාත්මක ප්‍රථම උපාධි අධ්‍යයන වැඩසටහන් පිරි නැමීම
- උපාධි අපේක්ෂකයින්ට ව්‍යවසායත්ව කුසලතා ලබා දීම
- උපාධි අපේක්ෂකයින්ගේ ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණ කුසලතා වර්ධනය කිරීම
- උපාධිධාරීන්ගේ රැකියා නියුක්ත කළ හැකි බව පිළිබඳ විභවයන් දියුණු කිරීම
- උපාධි අපේක්ෂකයින්ගේ මෘදු කුසලතා දියුණු කිරීම
- ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම හා ඒවාට සහයෝගය දීම
- ගුණාත්මක පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් හඳුන්වා දීම
- කාර්ය මණ්ඩලයේ නිපුණතාවන් හා කැපවීම සංවර්ධනය කිරීම

ක්‍රියාකාරිත්ව සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු පිණිස පීඨ විසින්ම විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව, උපාධි වැඩසටහනේ ගුණාත්මකතාව දියුණු කරනු පිණිස, පැවති වැඩසටහනේ විෂය නිර්දේශයන්ට ප්‍රතිශෝධන සහ නව ක්‍රමවේද හඳුන්වා දීම දැනටමත් සිදු කර ඇත.

හොඳින් කළමනාකරණය කරනු ලබන නේවාසිකාගාර පහසුකම්වලින් සැලකිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාවකට සෙත සැලසුණු අතර ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා මනා පරිසරයකින් යුක්ත ය. නේවාසික විශ්වවිද්‍යාලයකට අවශ්‍ය වන සියලුම පහසුකම් සපයා දීම මගින් ශිෂ්‍ය-ශිෂ්‍යාවන් තුළ සංස්කෘතික හා සදාචාරාත්මක සාරධර්ම ඇති කිරීම සම්බන්ධයෙන් හිතකාමී වටාපිටාවක් වර්ධනය කිරීමට මෙම විශ්වවිද්‍යාලය යත්න දරයි. සියලුම විද්‍යාර්ථීන් සේවා පිණ්ඩිතයන් තුනක් සපුරාලිය යුතු වේ. ඒවා නම්:- අධ්‍යයන ක්‍රියාකාරකම්, පර්යේෂණ හා සංස්ථායික සාමාජීය වගකීම් ය.

විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයට බැඳෙන තරුණ විද්‍යාර්ථීන් පුහුණු කිරීමට ඇපකැප වී සිටී. අයවැය බාධනයන් නොතකා, තරුණ පර්යේෂකයින්ට පර්යේෂණ ප්‍රජාව වෙත සිය සොයා ගැනීම් ඉදිරිපත් කිරීම මගින් සිය වෘත්තිය අරඹනු පිණිස, පර්යේෂණ අරමුදල් ලබා දෙනු ලැබීය. ඔවුන්ගේ පර්යේෂණ ප්‍රතිඵල ඉදිරිපත් කිරීමට හැකි වන සේ ඉතා කෙටි කාලපරිච්ඡේදයකින් පර්යේෂණ සැසි පවත්වනු ලැබේ. මෙම විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ඍජුවම ජාතික සම්පත් සංවර්ධනයට හා සමාජ සුභසාධනයට දායක වේ.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ දැක්ම හා මෙහෙවර සියලු කොටස්කරුවන්ට පැහැදිලි හා ප්‍රකට ය. එකිනෙකට වෙනස් ක්‍රියාකාරකම් සඳහා වූ වගකීම් භාරයන් ආයතනික සැලැස්ම තුළ පැහැදිලිව හඳුනා ගෙන තිබේ. විශ්වවිද්‍යාලය මූල්‍ය සම්පත් සඵලදායී ලෙස උපයෝගී කර ගනිමින් සිටී.

විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ වෘත්තීය ගමන් පථය සංවර්ධනය කරනු පිණිස විවිධ ඉගැන්වීම් වැඩසටහන් පවත්වා ඇති අතර ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට සිය වෘත්තීය ගමන් මාර්ගය හඳුනා ගත හැකි වනු පිණිස වැඩමුළු හා සම්මන්ත්‍රණ මෙහෙයවා ඇත.

විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් මෙහෙයවනු ලබන අතර අභිනවයෙන් බඳවා ගනු ලැබූ තරුණ කථිකාචාර්යවරුන් සඳහා ඉගැන්වීමේ ක්‍රමවේද පාඨමාලාව සතුටුදායක ලෙස පවත්වනු ලැබී ය. එයට අමතරව, අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කළමනාකරණ කුසලතා වර්ධනය කරනු පිණිස විවිධ වැඩමුළු හා සම්මන්ත්‍රණ පවත්වා ඇත.

ආචාර්ය පී. චන්ද්‍රසේන
උප කුලපති
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

4. මානව සම්පත් සහ ශිෂ්‍ය-ශිෂ්‍යාවෝ

පීඨය	අධ්‍යයන පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව
සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	සත්ව විද්‍යාව	178	57	සීධ තුන මෙන්ම පොදු පරිපාලනය සඳහා සේවය සලසන අනධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින් සිළුවෙළින් 82 දෙනෙක් සහ 16 දෙනෙක් වූහ.
	අපනයන කෘෂිකර්මය	160		
	තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම	144		
	ජලජ සම්පත් තාක්ෂණවේදය	160		
	තාල හා ක්ෂීර තාක්ෂණවේදය සහ අගය එක් කිරීම	138		
විද්‍යා හා තාක්ෂණවේද	විද්‍යාව හා තාක්ෂණවේදය	190	54	
	පරිගණක විද්‍යාව හා තාක්ෂණවේදය	208		
	කර්මාන්ත තොරතුරු තාක්ෂණය	177		
	ඛනිජ සම්පත් හා තාක්ෂණවේදය	157		
කළමනාකරණ	ව්‍යවසායකත්ව හා කළමනාකරණ අධ්‍යයනය	200	27	
	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය	199		
එකතුව		**1911**	**138**	

5. ශිෂ්‍ය-ශිෂ්‍යාවන් බඳවා ගැනීම පිළිබඳ විස්තර

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සෑම වර්ෂයකදීම එක් එක් උපාධි වැඩසටහන සඳහා ශිෂ්‍ය-ශිෂ්‍යාවන් 55 දෙනකු පමණක් බඳවා ගනී. ඔවුන් තෝරා ගනු ලබන්නේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල හා මෙම විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන අභියෝග්‍යතා පරීක්ෂණයක ප්‍රතිඵල පදනම් කර ගෙන ය.

පීඨය	අධ්‍යයන පාඨමාලාව	මාධ්‍යය	පළමු වසර ශිෂ්‍ය සංඛ්‍යාව (2012/2013 ශිෂ්‍ය කාණ්ඩය)	දෙවන වසර ශිෂ්‍ය සංඛ්‍යාව (2011/2012 ශිෂ්‍ය කාණ්ඩය)	තුන්වන වසර ශිෂ්‍ය සංඛ්‍යාව (2010/2011 ශිෂ්‍ය කාණ්ඩය)	සිවුවන වසර ශිෂ්‍ය සංඛ්‍යාව (2009/2010 ශිෂ්‍ය කාණ්ඩය)	උපාධිධාරීන් සංඛ්‍යාව (2008/2009 ශිෂ්‍ය කාණ්ඩය)
සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	සත්ව විද්‍යාව	ඉංග්‍රීසි	50	47	44	37	50
	අපනයන කෘෂිකර්මය		42	44	37	37	37
	තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම		39	23	41	41	42
	ජලජ සම්පත් තාක්ෂණවේදය		44	34	40	42	47
	තාල හා ක්ෂීර තාක්ෂණවේදය සහ අගය එක් කිරීම		33	24	45	36	39
විද්‍යා හා තාක්ෂණවේද	විද්‍යාව හා තාක්ෂණවේදය		51	50	43	46	35
	පරිගණක විද්‍යාව හා තාක්ෂණවේදය		49	67	48	44	39
	කර්මාන්ත තොරතුරු තාක්ෂණය		49	38	45	45	40
	ඛනිජ සම්පත් හා තාක්ෂණවේදය		45	32	42	38	36
කළමනාකරණ	ව්‍යවසායකත්ව හා කළමනාකරණ අධ්‍යයනය		53	52	49	46	47
	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය		49	55	47	48	32
එකතුව			**504**	**466**	**481**	**460**	**444**

අභිනව ශිෂ්‍ය කාණ්ඩයේ ස්ත්‍රී-පුරුෂ බෙදී යාම – 2014 (2012/2013 ශිෂ්‍ය කාණ්ඩය)

2014 වර්ෂය තුළ උපාධි ලැබූ ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ ස්ත්‍රී-පුරුෂ බෙදී යාම (2008/2009 ශිෂ්‍ය කාණ්ඩය)

6. අධ්‍යයන කාර්ය මණ්ඩලය

6.1 2014 වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

පීඨය	විෂය ක්ෂේත්‍රය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (i/ii ශ්‍රේණි)	කථිකාචාර්ය	කථිකාචාර්ය (පරිවාස)	තාවකාලික කථිකාචාර්ය/ ප්‍රදර්ශක
සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	සත්ව විද්‍යාව	ඉංග්‍රීසි	-	-	07	03	29	18
	අපනයන කෘෂිකර්මය							
	තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම							
	ජලජ සම්පත් තාක්ෂණවේදය							
	තාල හා ක්ෂීර තාක්ෂණවේදය සහ අගය එක් කිරීම							
විද්‍යා හා තාක්ෂණවේද	විද්‍යාව හා තාක්ෂණවේදය		-	-	9 (2)	02	18	23
	පරිගණක විද්‍යාව හා තාක්ෂණවේදය							
	කර්මාන්ත තොරතුරු තාක්ෂණය							
	බනිජ සම්පත් හා තාක්ෂණවේදය							
කළමනාකරණ	ව්‍යවසායකත්ව හා කළමනාකරණ අධ්‍යයනය		-	-	05	05	11	06
	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය							
	පුළුල් පොදු අධ්‍යාපන හා අත්‍යාවශ්‍ය කුසලතා	ඉංග්‍රීසි/ සිංහල/ දමිළ						
එකතුව			**-**	**-**	**21 (2)**	**10**	**58**	**47**

තාවකාලික ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සංඛ්‍යාව වරහන් තුළ දී ඇත ()

6.2 පුස්තකාල කාර්ය මණ්ඩලය

කේ.එම්.ආර්.කේ. කුලතුංග මිය, බී.ඒ. (පේරාදෙණිය), දුරස්ථ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ඉන්දියාව), එම්.එල්.අයි.එස්.සී. (දිල්ලි) - සහකාර පුස්තකාලාධිපතිනි (2013.07.25 දින සිට අධ්‍යයන නිවාඩු ලබා සිටී.)

ඩී.පී.සී. විතාන මිය, බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර) - සහකාර පුස්තකාලාධිපතිනි

ටී. ප්‍රදීපන් මහතා, බී.ඉකෝන් (නැගෙනහිර විශ්වවිද්‍යාලය), එම්.එස්.සී. එල්.අයි. (ඉන්දියාව), මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ඉන්දියාව) - සහකාර පුස්තකාලාධිපති (2013.12.01 දින සිට අධ්‍යයන නිවාඩු ලබා සිටී.)

එස්.එස්. ජොහොරාන් මිය, බී.එස්.සී. (සබරගමුව විශ්වවිද්‍යාලය) (කොන්ත්‍රාත් පදනමින්)

7. පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය

7.1 පරිපාලන කාර්ය මණ්ඩලය

2014 වර්ෂය තුළ පරිපාලන කාර්ය මණ්ඩලයේ එක් එක් ප්‍රභේදය යටතේ සේවය සැලසූ සාමාජික සංඛ්‍යා පහත පරිදි වේ:-

ප්‍රභේදය	කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව
ලේඛකාධිකාරී	01 (කොන්ත්‍රාත්)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	02
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	04
ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක	01
සහකාර ලේඛකාධිකාරී	03
සහකාර මූල්‍යාධිකාරී	-
විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරි	01
ව්‍යාපෘති කළමනාකාර (කොන්ත්‍රාත් පදනමින්)	01
ප්‍රධාන ආරක්ෂක නිලධාරි	01 (කොන්ත්‍රාත්)
ප්‍රධාන මාර්ෂල්	-
වෙනත්	02
එකතුව	**16**

මූල්‍යාධිකාරී, ප්‍රධාන ආරක්ෂක නිලධාරී හා ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ යන තනතුරු පුරප්පාඩු වී පැවතුණි.

7.2 අනධ්‍යයන කාර්ය මණ්ඩලය

තාක්ෂණික නිලධාරීන්ගේ සේවාවන් හැර අන් සියලුම ලිපිකාර හා සමාන්තර ශ්‍රේණිවල සේවාවන් පුහුණුලාභීන් හරහා ලබා ගනු ලැබූ අතර ඔවුන් පසුව පැවරුම් පදනමින් මෙහෙයුම් සහකාරවරුන් ලෙස පත් කරන ලදී. පරිගණක ආශ්‍රිත කාර්යයන්, ලිපිකාර කාර්යයන්, මෙහෙයුම් කාර්යයන් හා ලේකම් කාර්යයන් ඇතුළු කර්තව්‍යන් රාශියක් මෙහෙයුම් සහකාරවරු ඉටු කරති. අපගේ විශ්වවිද්‍යාලයේ පරිපාලනය මෙහෙයුම් සාර්ථකත්වය ඉලක්ක කොට ගෙන මෙහෙයවනු ලබන අතර, මෙහෙයුම් සහකාරවරු සිය කුසලතා ප්‍රදර්ශනය කිරීමෙන් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ක්‍රමෝපායෙහි සාර්ථකත්වය ඔප්පු කර ඇත.

සියලුම පත්විමිලාභීන් ඌව පළාතේම අය වන අතර, ඔවුහු විශ්වවිද්‍යාලය සමීපයේ පදිංචිව සිටිති. සියලු අනධ්‍යයන හා උපකාරක කාර්ය මණ්ඩල ප්‍රභේද හා සංඛ්‍යාවන් පහත දැක්වේ:-

ප්‍රභේදය	කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව
තාක්ෂණික නිලධාරී	02
පරිගණක යෙදුම් සහකාර (CAA) (අනියම්)	04
මෙහෙයුම් සහකාර (OA) (පැවරුම් පදනමින්)	20
පුහුණුලාභී	54
ගබඩා භාරකාර	01
සරප්	01

තවද, උප ශිෂ්‍යාගාරාධිපතිවරුන් දෙදෙනකුගේ හා ක්‍රීඩා නිලධාරියකුගේ සේවාවන් බාහිර සේවා සම්පාදකයින් වෙතින් සපුරා ගන්නා ලදී.

7.3 අනධ්‍යයන කාර්ය මණ්ඩලය බෙදී ගොස් ඇති ආකාරය

පීඨය / ශාඛාව	වඩාත්ම ජ්‍යෙෂ්ඨ	මෙහෙයුම් සහකාර සහ පරිගණක යෙදුම් සහකාර	පුහුණුලාභීන්	සෙසු සේවකයෝ
උප කුලපති කාර්යාලය	-	02	-	කිසිවකුත් නැත *
ලේඛකාධිකාරී කාර්යාලය	-	01	01	
සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය	-	02 (01**)	04	
විද්‍යා හා තාක්ෂණවේද පීඨය	-	03 (01**)	07	
කළමනාකරණ පීඨය	-	-	04	
ශිෂ්‍ය කටයුතු අංශය	-	03	06	
මානව සම්පත් අංශය	-	02	02	
සාමාන්‍ය පරිපාලන අංශය	-	03	01	
විභාග අංශය	-	03	07	
ප්‍රසම්පාදන අංශය	-	01	03	
ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක	-	01	01	
මූල්‍ය අංශය	-	01 (02***)	07	
පුස්තකාලය	-	01	07	
වෛද්‍ය මධ්‍යස්ථානය	-	01	01	
ව්‍යාපෘති	-	-	03	
එකතුව	-	**28**	**54**	

* මෙම විශ්වවිද්‍යාලය කිසිදු සුළු සේවකයෙක් බඳවා ගෙන නොමැත. සුළු සේවකයින්ගේ සේවාවන් සේවා සම්පාදකයින් වෙතින් ලබා ගනු ලැබේය.

** තාක්ෂණික නිලධාරීන් (2)

*** සරප් හා ගබඩා භාරකරු (2)

8. පර්යේෂණ, නව්‍යකරණ හා ප්‍රකාශන

2014 වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ පර්යේෂණ, නව්‍යකරණ හා ප්‍රකාශන

විෂයය	ප්‍රකාශිත සංඛ්‍යාව	වාණිජකරණය කරන ලද සංඛ්‍යාව	ඉදිරිපත් කරන ලද සංඛ්‍යාව
පර්යේෂණ අධ්‍යයන සංඛ්‍යාව	105	-	59
නව්‍යකරණ / නිපැයුම් / නිෂ්පාදන සංවර්ධන සංඛ්‍යාව	14	-	05
ජර්නල් සහ ලිපි සංඛ්‍යාව	34	-	-
ග්‍රන්ථ/පරිච්ඡේද සංඛ්‍යාව	09	-	01
උද්ධෘත සංඛ්‍යාව	99	-	37
පෝස්ටර් සංඛ්‍යාව	20	-	21
එකතුව	**281**	**-**	**123**

9. වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු

විෂයය	පිරිනමන ලද / සහභාගි වූ	සම්පූර්ණ කළ	ඉදිරිපත් කිරීම් කළ
උපාධි වැඩසටහන් සංඛ්‍යාව	42	13	-
සහතිකපත්‍ර වැඩසටහන් සංඛ්‍යාව	09	11	01
ප්‍රජා සේවා සම්පාදන වැඩසටහන් සංඛ්‍යාව	35	28	23
කාර්ය මණ්ඩල සංවර්ධන, සම්මන්ත්‍රණ හා වැඩමුළු සංඛ්‍යාව	50	14	03
එකතුව	**136**	**66**	**27**

10. ලැබුණු සම්මාන ප්‍රදානයන් පිළිබඳ විස්තර

විෂයය	සම්මාන සංඛ්‍යාව	විද්වතුන් සංඛ්‍යාව	ශිෂ්‍ය සංඛ්‍යාව
දේශීය සම්මාන ප්‍රදානයන්	05	-	-
ජාත්‍යන්තර සම්මාන ප්‍රදානයන්	07	-	-
එකතුව	**12**	-	-

11. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

විෂයය	2014 (රුපියල්)	2013 (රුපියල්)
අ.පුද්ගල පඩිනඩි	159,510,038	121,219,347
ආ. ගමන් වියදම්	1,484,599	1,957,928
ඇ. සැපයුම්	9,223,701	9,467,163
ඈ. නඩත්තුව	2,962,331	1,817,403
ඉ. ගිවිසුම්ගත සේවා	119,325,799	112,870,761
ඊ. වෙනත්	18,602,963	17,578,202
එකතුව	**311,109,431**	**264,910,804**

12. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

විෂයය	2014 (රුපියල්)	2013 (රුපියල්)
අ. ඉඩම් අත්කර ගැනීම	5,350,000	-
ආ. ගෘහභාණ්ඩ හා වෙනත් උපකරණ අත්කර ගැනීම	12,773,206	73,806,688
ඇ. යන්ත්‍රෝපකරණ අත්කර ගැනීම	20,281,326	2,447,744
ඉ. ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් අත්කර ගැනීම	116,769,530	184,604,627
ඊ. වෙනත්	3,062,770	2,978,366
එකතුව	**158,236,832**	**263,837,425**

13. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සම්පාදිත)

නම හා විස්තර	ණය/ ප්‍රදානය	අරමුදල් සම්පාදන ආයතනය #	සමස්ත පිරිවැය ඇස්තමේන්තුව (රුපියල් මිලියන)	RFA	DF
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ව්‍යාපෘතිය ස්ථාපනය කිරීම 1 හා 2 අදියර	-	-	3,420.00	-	✓
එකතුව	-	-	**3,420.00**	-	-

14. ව්‍යාපෘති වියදම පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සම්පාදිත)

නම	සමස්ත පිරිවැය ඇස්තමේන් තුව (රුපියල් මිලියන)	2014 වර්ෂයේ වියදම (රුපියල් මිලියන)	2013 වර්ෂයේ වියදම (රුපියල් මිලියන)	2014.12.31 දිනට සමුච්චිත වියදම (රුපියල් මිලියන)	භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය (%)
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ව්‍යාපෘතිය ස්ථාපනය කිරීම 1 හා 2 අදියර	3,420.00	184.60	70.80	1,900.50	63%
එකතුව	**3,420.00**	**184.60**	**70.80**	**1,900.50**	**63%**

15. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම)

රුපියල්

විෂයය	2014 වර්ෂයේ ප්‍රතිපාදනය	2014 වර්ෂයේ වියදම	ඉතුරුම්/(අතිරික්ත වියදම)
අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන	376,000,000	311,109,431	64,890,569
ආ. ව්‍යාපෘති හැර ප්‍රාග්ධන	146,500,000	87,434,919	59,065,081
ඇ. ව්‍යාපෘති - දේශීය අරමුදල් සම්පාදිත	83,500,000	70,801,913	12,698,087
ඈ. ව්‍යාපෘති - විදේශීය අරමුදල් සම්පාදිත	-	-	-
එකතුව	**606,000,000**	**469,346,263**	**136,653,737**

16. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම)

ආදායම් මූලාශ්‍රය	2014 වර්ෂයේ ප්‍රතිපාදන (රුපියල්)	2014 වර්ෂයේ රැස් වූ මුදල (රුපියල්)	හිඟය/අතිරික්තය (රුපියල්)
අ. ප්‍රථම උපාධි අධ්‍යයනය (නේවාසිකාගාර හා ලියාපදිංචි ගාස්තු ආදිය)	14,550,000	11,809,344	3,190,656
ආ. පශ්චාත් උපාධි අධ්‍යයනය	-	-	-
ඇ. උපදේශකත්වය (පුහුණුව, විභාග හා වෙනත්)	450,000	343,400	343,400
ඈ. වෙනත්	-	-	-
එකතුව	**15,000,000**	**12,152,744**	**3,534,056**

17. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2014

විෂයය	සූත්‍රය	ඒක-ශිෂ්‍ය වියදම (රුපියල්)
අ. එක් ශිෂ්‍යයකු සඳහා පුනරාවර්තන වියදම	පුනරාවර්තන වියදම - ශිෂ්‍ය සංඛ්‍යාව	240,948
ආ. එක් ශිෂ්‍යයකු සඳහා ප්‍රාග්ධන වියදම	ප්‍රාග්ධන වියදම - ශිෂ්‍ය සංඛ්‍යාව	83,282
එකතුව		**324,230**

18. 2014 වර්ෂයේදී සංවර්ධනය කරන ලද යටිතල පහසුකම් පිළිබඳ විස්තර

යටිතල පහසුකම් විස්තර	වියදම (රුපියල්)	භෞතික ප්‍රගතිය
පරීක්ෂණාගාර සංකීර්ණය - ඊ ගොඩනැගිල්ල (ජාලය)	627,849	100%
ක්‍රීඩා මධ්‍යස්ථානය	16,847,858	10%
ඩී. ඊ. හා එෆ්. ගොඩනැගිලි ප්‍රදේශයේ භූමි දර්ශක කටයුතු	4,285,875	100%
ආපන ශාලාව හා වැසිකිලි ප්‍රදේශයේ භූමි දර්ශක කටයුතු	3,294,557	100%
ආපන ශාලාවේ හා වැසිකිලි පද්ධති නවීකරණ කටයුතු	5,390,000	100%
සනාතන මණ්ඩල ගොඩනැගිල්ල ඉදිකිරීම	23,504,043	65%
විශ්වවිද්‍යාල සංචාරක නිවාසය ඉදිකිරීම	6,947,806	100%
ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම	8,331,970	85%

19. 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		2014	2013
		රුපියල්	රුපියල්
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සම දේ	01	8,526,006	1,335,207
ආයෝජන	02	12,554,808	2,633,737
ලැබිය යුතු	03	10,464,501	11,900,961
තොගය	04	3,162,310	5,431,453
අත්තිකාරම්	05	113,744	198,262
		34,821,369	21,499,620
ජංගම නොවන වත්කම්			
ලැබිය යුතු	06	6,417,887	5,602,480
දේපළ, පිරියත හා යන්ත්‍රෝපකරණ	07	1,508,243,648	1,290,305,122
සිදු කෙරෙමින් ඇති වැඩ	08	167,994,886	365,641,418
ඉඩම් අත්කර ගැනීම	09	58,366,399	53,016,399
ගුණාත්මකතා වර්ධන ව්‍යාපෘති	10	2,476,396	1,206,090
		1,743,499,217	1,715,771,510
මුළු වත්කම්		1,778,320,586	1,737,271,130
බැරකම්			
ජංගම බැරකම්			
උපචිත වියදම්	11	16,613,210	39,129,463
විවිධ ණයහිමියෝ ආදිහු	12	87,920,015	111,221,850
		104,533,225	150,351,313
ජංගම-නොවන බැරකම්			
විලම්බිත ආදායම	13	159,021,600	133,457,306
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය	14	7,722,914	6,813,256
		166,744,514	140,270,562
මුළු බැරකම්		271,277,739	290,621,875
ශුද්ධ වත්කම්		1,507,042,847	1,446,649,255
ශුද්ධ වත්කම්/කොටස් භාරය			
සමුච්චිත අරමුදල	15	1,940,711,050	1,831,042,417
පොදු සංචිතය	16	(452,282,559)	(394,580,896)
විශේෂ සංචිතය	17	1,897,846	1,830,484
විශේෂ අරමුදල්	18	16,716,509	8,357,250
මුළු ශුද්ධ වත්කම්/ කොටස් භාරය		1,507,042,847	1,446,649,255

20. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2014	2013
		රුපියල්	රුපියල්
ආදායම			
පුනරාවර්තන ප්‍රදානය	19	326,702,000	203,000,000
ශිෂ්‍යධාර හා මහපොළ ප්‍රදාන	20	15,368,900	21,108,150
ස්වයං-මූල්‍යකරණ වැඩසටහනේ ආදායම	21	343,400	553,000
වෙනත් ආදායම්	22	11,809,374	13,191,742
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	23	43,767,073	40,788,873
මුළු ආදායම		**397,990,747**	**278,641,765**
වියදම්			
පුද්ගල පඩිනඩි	24	159,510,038	121,219,347
ගමන් වියදම්	25	1,484,599	1,957,928
සැපයුම්	26	9,223,701	9,467,163
නඩත්තුව	27	2,962,331	1,817,403
ගිවිසුම්ගත වියදම	28	119,325,799	112,870,761
වෙනත් පුනරාවර්තන වියදම්	29	18,602,962	17,578,202
ස්වයං-මූල්‍යකරණ වැඩසටහනේ වියදම්	30	-	418,496
ශිෂ්‍යධාර හා මහපොළ ගෙවීම්	31	15,368,900	21,108,150
ක්ෂය	32	131,324,532	115,616,976
මුළු වියදම්		**457,802,863**	**402,054,426**
අදාළ කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (හිඟය)		(59,812,116)	(123,412,661)

21. 2014 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2014	2013
	රුපියල්	රුපියල්
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහයන්		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වෙතින් ඌණතාව/ අතිරික්තය	(59,812,116)	(123,412,661)
මුදල්-නොවන සංචලනයන්		
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	(43,767,073)	(40,788,873)
ක්ෂය	131,324,532	115,616,976
ප්‍රතිපාදන හා වෙනත්	2,923,544	2,294,002
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	30,668,887	(46,290,557)
ආයෝජනවල (වැඩි වීම)/ අඩු වීම	(9,921,070)	
අයවිය යුතු මුදල් (වැඩි වීම)/ අඩු වීම (CA)	1,436,459	4,710,833
අයවිය යුතු මුදල් (වැඩි වීම)/ අඩු වීම (NCA)	(815,407)	(920,023)
තොගය (වැඩි වීම)/ අඩු වීම	2,269,143	(2,572,671)
අත්තිකාරම් (වැඩි වීම)/ අඩු වීම	84,518	(102,263)
උපචිත වියදම් වැඩි වීම/ (අඩු වීම)	(22,352,323)	31,289,875
විවිධ ණයහිමියෝ වැඩි වීම/ (අඩු වීම)	(23,301,835)	11,312,047
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්	(21,931,628)	**(2,572,758)**
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහයන්		
ස්ථාවර වත්කම් අත්කර ගැනීම	(158,236,832)	(264,756,547)
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්	(158,236,832)	(264,756,547)
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහයන්		
සමුච්චිත අරමුදල	109,668,633	187,350,674
විලම්බිත ආදායම	69,331,367	66,649,326
වෙනත් අරමුදල්	8,359,260	5,235,103
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වෙතින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්	187,359,260	259,235,103
මුදල් හා මුදල් සමාන දේ හි ශුද්ධ වැඩි වීම / (අඩු වීම)	7,190,799	(8,094,203)
කාලපරිච්ඡේදය මුලදී මුදල් හා මුදල් සමාන දේ	1,335,207	9,429,410
කාලපරිච්ඡේදය අගදී මුදල් හා මුදල් සමාන දේ	8,526,006	1,335,207

සටහන - 2014.12.31 දිනට බැංකු ශේෂ		
බැංකුව	**ගිණුම් අංකය**	**මුදල (රුපියල්)**
ලංකා බැංකුව	3114828	4,307,897
ලංකා බැංකුව	3114820	2,819,475
මහජන බැංකුව	10100168384805	1,398,635
එකතුව		**8,526,006**

22. විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } UV/BD/D/UWU/1/14/09 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2015 [illegible]

UVA - WELLASSA UNIVERSITY OF SRI LANKA
28 OCT 2015
VC's OFFICE

උපකුලපති
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවමි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

පිටපත් :- 01. ලේකම් - විශ්වවිද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
02. ලේකම් - මුදල් අමාත්‍යාංශය
03. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } UV/BD/D/UWU/1/14/09 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2015 [illegible] දින

උපකුලපති
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1)වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108 (2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත 2015 මැයි 13 දින නිකුත් කරන ලදී.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

02. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ප්‍රමිතිවලට අනුකූලව කටයුතු නොකළ අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02

(i) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගිණුම්ගත කළයුතු වත්කම් අත්පත් කර ගැනීම සඳහා ලැබුණු රු.187,359,260 ක් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති ස්ථාවර වත්කම් මිලදී ගැනීමට අදාල මුදල් ගලායාම් රු.158,236,832 ක් උපචිත පදනම මත ගිණුම්ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09

සමාලෝචිත වර්ෂය අවසානයට වූ ලිපිද්‍රව්‍ය තොගය තුළ 2009 වර්ෂයේ මුද්‍රණය කරන ලද ප්‍රයෝජනයට ගත නොහැකි පිරිවැය රු. 116,895 ක්වූ ශිෂ්‍ය අත්පොත් 293 ක් ඇතුළත්ව තිබූ නමුත් එවැනි තොග අගය කිරීම සම්බන්ධව ගිණුම් පතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් උපචිත පදනම මත ගිණුම් පිළියෙල කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු වියදම් රු.2,925,867 ක් හා ලැබිය යුතු ආදායම් රු.266,104 ක් වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ ගෙවිය යුතු බාහිර පාඨමාලා වියදම් වෙනුවෙන් රු. 345,000 ක අධි වෙන්කිරීමක් සිදුකර තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාල රු. 181,070 ක්වූ වියදම අධි වෙන්කිරීමෙන් ලියාහැර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ වියදම සම්බන්ධව හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන්ගෙන් මිළදීගත් එකතුව රු.305,023 ක්වූ ප්‍රාග්ධන භාණ්ඩ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

2.2.3 **නොසැසඳු පාලන ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ උපලේඛන සැසඳීමේදී ලැබිය යුතු ශිෂ්‍යාධාර හා ලැබිය යුතු මහපොළ අතර පිළිවෙලින් රු. 660,671 ක හා රු.765,100 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද ඉකුත් වර්ෂයේ සිට ඉදිරියට ගෙනා හඳුනා නොගත් ලැබිය යුතු ශිෂ්‍යාධාර රු. 170,321 ක් ඇතුලත්ව තිබූ බව නිරීක්ෂණය විය.

2.2.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පහත සඳහන් එකතුව රු. 4,408,295 ක් වටිනා ගිණුම් විෂයයන් 04 ක් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

	ගිණුම් විෂයය	වටිනාකම	ඉදිරිපත් නොකළ සාක්ෂි
		රු.	
(i)	ආපසු ගෙවිය යුතු තැන්පත්	1,997,840	i. කාල විශ්ලේෂණ
(ii)	ආපසු ගෙවිය යුතු ආරක්ෂක තැන්පත්	647,953	ii.කේවල ශේෂ ලැයිස්තුව
(iii)	පොදු තැන්පත්-පුනරාවර්තන	1,524,607	iii. තැන්පත් ලේඛන
(iv)	පොදු තැන්පත්-ප්‍රාග්ධන	237,895	
	එකතුව	4,408,295	

2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 ජනවාරි සිට ජූලි දක්වා වූ කාලය වෙනුවෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකු වෙත ගෙවා තිබුණු රු.93,546 ක පර්යේෂණ දීමනා අයකරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 7,179,806 ක්වූ ආපදා ණය ශේෂය තුළ 2007 හා 2008 වර්ෂවලදී නිලධාරින් 02 දෙනෙකු වෙත ලබාදුන් රු.165,183 ක ආපදා ණය ශේෂයන් අයවීම අත්හිටවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 96,000 ක්වූ උත්සව අත්තිකාරම් ණය ශේෂය තුළ 2010, 2011 හා 2013 අප්‍රේල් මාසවලදී නිලධාරින් 03 දෙනෙකු වෙත ලබාදුන් රු. 10,000ක උත්සව අත්තිකාරම් ණය ශේෂයන් අයවීම අත්හිටවී තිබුණි.

(ඈ) 2006 වර්ෂයේ සිට 2015 දක්වා කාලය තුළ විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු ඉටුකරන ලද මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට (CECB) ගෙවිය යුතු රු. 61,989,351 ක ප්‍රමාණයක් නිරවුල් කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.4 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

	නීති,රීති හා රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**
(අ)	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත	
	(i) 37 (1) වගන්තිය	සංයුතිය නියම කළ තෝරා ගැනීමේ කමිටුවක නිර්දේශ මත පාලක සභාව විසින් විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරි පත්කළ යුතු නමුත් පාලක සභාවේ අනුමැතියට යටත්ව උපකුලපතිවරයා විසින් පැවරුම් පදනම මත විශ්‍රාමික ලේඛකාධිකාරිවරයකු එම තනතුර සඳහා පත් කර තිබුණි.

	(ii) 108 (3)(2)වගන්තිය	විගණකාධිපතිවරයාගේ වාර්තාව එවීමෙන් පසු මාස තුනක් ඇතුළත ඒ වාර්තාවෙහි පෙන්නුම් කරන ලද කරුණු සම්බන්ධයෙන් ගන්නා ලද හෝ ගැනීමට යෝජිත පියවර විගණකාධිපතිවරයා වෙත දැන්විය යුතු නමුත් 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.
(ආ)	1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය	සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ)	1985 අංක 01 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතින් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වගන්තිය හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත	විධිවිධාන ප්‍රකාරව අවුරුදු 02 කට වැඩි කාලයක් තිස්සේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල රාජකාරි ඉටුකරනු ලබන පුහුණුලාභීන් 28 දෙනෙකු වෙනුවෙන් දායක මුදල් අරමුදල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඈ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,100,000,044 ක් වටිනා දේපල පිරියත හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(ඉ)	2003 ජූනි 03 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.1 හා 7.2 වගන්ති	විශ්වවිද්‍යාල ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබුණි.
(ඊ)	2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 03 වගන්තිය	ගෙවීම් වටිනාකම රු. 25,000 කට වැඩි ගෙවීම් මත රු.25 ක මුද්දර ගාස්තු අයකරගත යුතු නමුත් නියැදි පරීක්ෂාවට අනුව අවස්ථා 16 කදී එකතුව රු.1,019,661 ක් ගෙවීම් සම්බන්ධයෙන් නියෝග අනුව කටයුතු කර නොතිබුණි.
(උ)	2011 පෙබරවාරි 21 දිනැති අංක 449 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	කාර්ය පැවරුම් පදනම මත වූ පත්වීම්, දින 45 ක් නොඉක්මවන හා පැවරුමකට ගෙවිය හැකි උපරිම මුදල රු.30,000 ක් වූව ද ඊට පටහැනිව කාර්ය පැවරුම් පදනම මත විශ්‍රාමික නිලධාරීන් 03 දෙනෙකු වෙත චක්‍රලේඛ ප්‍රතිපාදන සීමාව ඉක්මවා ගෙවන ලද රු.718,539 ක් සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

	(ii) 108 (3)(2)වගන්තිය	විගණකාධිපතිවරයාගේ වාර්තාව එවීමෙන් පසු මාස තුනක් ඇතුළත ඒ වාර්තාවෙහි පෙන්නුම් කරන ලද කරුණු සම්බන්ධයෙන් ගන්නා ලද හෝ ගැනීමට යෝජිත පියවර විගණකාධිපතිවරයා වෙත දැන්විය යුතු නමුත් 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.
(ආ)	1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය	සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ)	1985 අංක 01 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතින් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වගන්තිය හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත	විධිවිධාන ප්‍රකාරව අවුරුදු 02 කට වැඩි කාලයක් තිස්සේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල රාජකාරි ඉටුකරනු ලබන පුහුණුලාභීන් 28 දෙනෙකු වෙනුවෙන් දායක මුදල් අරමුදල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඈ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,100,000,044 ක් වටිනා දේපල පිරියත හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(ඉ)	2003 ජුනි 03 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.1 හා 7.2 වගන්ති	විශ්වවිද්‍යාල ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබුණි.
(ඊ)	2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 03 වගන්තිය	ගෙවීම් වටිනාකම රු. 25,000 කට වැඩි ගෙවීම් මත රු.25 ක මුද්දර ගාස්තු අයකරගත යුතු නමුත් නියැදි පරීක්ෂාවට අනුව අවස්ථා 16 කදී එකතුව රු.1,019,661 ක් ගෙවීම් සම්බන්ධයෙන් නියෝග අනුව කටයුතු කර නොතිබුණි.
(උ)	2011 පෙබරවාරි 21 දිනැති අංක 449 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	කාර්ය පැවරුම් පදනම මත වූ පත්වීම්, දින 45 ක් නොඉක්මවන හා පැවරුමකට ගෙවිය හැකි උපරිම මුදල රු.30,000 ක් වුව ද ඊට පටහැනිව කාර්ය පැවරුම් පදනම මත විශ්‍රාමික නිලධාරීන් 03 දෙනෙකු වෙත චක්‍රලේඛ ප්‍රතිපාදන සීමාව ඉක්මවා ගෙවන ලද රු.718,539 ක් සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ඌ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උපාධි අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 01 වන පරිච්ඡේදය හා මුදල් රෙගුලාසි 758	සමාලෝචිත වර්ෂය සඳහා නියමිත කාල පරතර තුළදී වාර්ෂික සමීක්ෂණයට අමතරව ගබඩා සමීක්ෂණ සිදුකර නොතිබුණි.
(එ)	2010 පෙබරවාරි 05 දිනැති අංක 920 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 5(viii) ඡේදය	වැටුප් පරිවර්තන සිදුවන අවස්ථාවන්හිදී ආචාර්යවරුන් 26 දෙනෙකුට අදාල බැඳුම්කර සංශෝධනය කර නොතිබුණි.
(ඒ)	2013 අගෝස්තු 29 දිනැති අංක 12/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ආයතනික චක්‍රලේඛය	ජ්‍යෙෂ්ඨ නිලධාරින්ට භූමි නිවාසවල, තනිකඩ බද්ධ නිවාසවල පදිංචි නිලධාරින්ගෙන් නිවාස කුලිය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඔ)	විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ v පරිච්ඡේදයේ 7.6 ඡේදය	බැඳුම්කර හා ගිවිසුම් කොන්ත්‍රාත් කඩකිරීම සම්බන්ධයෙන් ආචාර්යවරුන් දෙදෙනෙකුගෙන් රු.8,220,772 ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතුව තිබුණි.

03. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.59,812,116 ක ඌනතාවය ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.123,412,661 ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.63,600,545 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

04. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ශිෂ්‍යයින් 1,900 දෙනෙකුගේ අධ්‍යයන කටයුතු වෙනුවෙන් දරන ලද පිරිවැය රු.457,802,863 ක් වූ අතර ඒක ශිෂ්‍ය පිරිවැය රු.240,949 ක් විය. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 1,423 දෙනෙකුගේ අධ්‍යයන පිරිවැය රු.401,635,931 ක්වූ අතර, ඒක ශිෂ්‍ය පිරිවැය රු.282,246 ක් විය. මේ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.41,297 කින් අඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දිවයිනේ විශ්වවිද්‍යාලවල 1:17 ක්වූ සාමාන්‍ය කථිකාචාර්ය ශිෂ්‍ය අනුපාතයට සාපේක්ෂව විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය ශිෂ්‍ය අනුපාතය 1:16 ක් විය.

(ඇ) සංයුක්ත සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය සඳහා සිසුන් 605 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් කර තිබූ නමුත් සිසුන් 507 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණි.ඒ අනුව අපේක්ෂිත සංඛ්‍යාවෙන් සිසුන් 98 දෙනෙකු එනම් සියයට 16 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

(ඈ) 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ස්වආදායම් ඉපයීමේ පාඨමාලා පැවැත්වීමෙන් ඉපයූ ආදායම සියයට 37 කින් අඩු වී තිබුණි.

4.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක : 05/0183/035/001 යටතේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා 2008 පෙබරවාරි 10 දින පැවැත්වුණ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ඉඩම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාලව ගත් තීරණය අනුව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා දැනට වෙන්කරනු ලැබ ඇති හෙක්ටයාර් 30.9667 ක ඉඩම්වල අයිතිය විශ්වවිද්‍යාලය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 **අරමුදල් උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සංශෝධිත අයවැය ඇස්තමේන්තුවෙන් මූලධන වියදම් සඳහා ලබාදී තිබුණ රු. 230,000,000 ක්වූ ප්‍රතිපාදනයෙන් රු. 71,763,168 ක් ඉතිරිකර තිබුණි. එය සමස්ථ මූලධන ප්‍රතිපාදනයෙන් සියයට 31 කි.

(ආ) තොරතුරු තාක්ෂණ සංවර්ධනය, ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්, ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය, ව්‍යාපාර උපදේශන ඒකකය හා නවෝත්පාදන භාණ්ඩ යන ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක් සඳහා වෙන්කර තිබුණ රු.7,000,000 ක මුළු ප්‍රතිපාදනයම වියදම් නොකර ඉතිරි කර තිබුණි.

(ඇ) පර්යේෂණ දිරිමත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අයවැයගත මූලධන ප්‍රතිපාදනය වූ රු.25,000,000 කින් උපයෝජනය කර තිබුනේ රු. 554,266 ක් පමණි. ඒ අනුව රු. 24,445,734 ක ප්‍රතිපාදන ඉතිරියක් වී තිබූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 98 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් "බදුල්ල" විසින් පටක රෝපණ ව්‍යාපෘතිය සඳහා ලබා දෙන ලද රු.3,323,000 ක් පොදු තැන්පත් ප්‍රාග්ධන ගිණුමට බැරකර තිබූ නමුත් 2015 මාර්තු 31 දින වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

4.4 **ආර්ථික නොවූ ගනුදෙනු**

සමාලෝචිත වර්ෂයේ සෑම මසකම බාහිර පාඨමාලා වලින් ඉපයූ ආදායමෙන් රු.ලක්ෂ 10 ක මුදලක් ජංගම ගිණුමේ තිබූ නමුත් එය ආයෝජනය කර පොළියක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.5 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 ජුනි 30 දින මිලදීගෙන තිබූ රු.322,560 ක් වටිනා ගිනි ආරක්ෂණ සේප්පු 05 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී ඉංජිනේරු වැඩහල සඳහා මිලදී ගෙන තිබූ රු. 14,060,480 ක් වටිනා 3-Axis CNC යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි.

(ඇ) බාහිර පාඨමාලා අංශයට රු.1,117,933 ක වටිනාකමැති ස්ථාවර වත්කම් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ "HETC" ව්‍යාපෘතිය හරහා පිරිනමා තිබූ නමුත් එම වත්කම් ඵලදායි ලෙස බාහිර පාඨමාලා අංශයේ අරමුණු ඉටුකර ගැනීමට උපයෝජනය කර නොමැති බව දක්නට ලැබිණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ මූල්‍ය අංශයේ පරිපාලන කටයුතු පහසුකර ගැනීමට 2013 වර්ෂයේ මිලදී ගත් රු.222,768 ක් වටිනා ගිණුම්කරණ පරිගණක මෘදුකාංගය වර්තමානයේ චෙක්පත් මුද්‍රණය සඳහා පමණක් යොදා ගන්නා බව දක්නට ලැබිණි.

4.6 **දෘශ්‍ය අක්‍රමිකතා**

සමාලෝචිත වර්ෂයේදී පැවැත්වූ උපාධි ප්‍රදානෝත්සවය ඡායාරූප ගත කිරීම හා වීඩියෝගත කිරීමට අදාල සැපයුම්කරු තෝරාගැනීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.5, 5.2.1(අ), 6.3.2, 6.3.3, 6.3.3.1 (අ) මාර්ගපදේශයට පටහැනිව කටයුතු කර තිබුණු අතරම මාර්ගෝපදේශයේ 1.21 හි සඳහන් අරමුණු හා මාර්ගෝපදේශයේ 1.4 හි සඳහන් ආචාරධර්ම උල්ලංඝණය කර තිබුණි. එමෙන්ම තෝරාගත් සැපයුම්කරු විසින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් අනුව 10"× 12" ප්‍රමාණයේ ඡායාරූපයක් රු.100 ක් බව සඳහන් වන නමුත් උපාධි අපේක්ෂකයන් වෙත ඡායාරූපයක් රු.336 ක් වැනි මුදලකට අලෙවි කර ඇති බව විගණනයේදී තහවුරු විය. ඒ අනුව රු. 104,784 ක් අයථා අන්දමින් උපයා ගැනීමට විශ්වවිද්‍යාලය විසින් ආධාර අනුබල ලබාදී තිබුණි. තවද මේ සම්බන්ධයෙන් හිමිකම හා අයිතිය විශ්වවිද්‍යාලය සතු වන නමුත් එම අයිතිය සම්බන්ධව විශ්වවිද්‍යාල අරමුදලට කිසිදු අයකිරීමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.7 **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේදී ඇගළුම් කර්මාන්ත ගොඩනැගිල්ල සඳහා රු.41,247,644 ක් වැයකර නවීකරණය කරන ලද නමුත් වහලින් ජලය කාන්දු වීම හේතුවෙන් සිවිලිම අබලන් වෙමින් පැවතුණ අතර යථෝක්ත ගොඩනැගිල්ලේ වහල සමාලෝචිත වර්ෂයේ ජනවාරි - අප්‍රේල් කාල පරිච්ඡේදය තුළ පුනරුත්තාපනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉදිකිරීම් ව්‍යාපෘති සැලසුම් සකස් කිරීමෙන් පසුව අවශ්‍ය ප්‍රමාණපත්‍ර (BOQ) සකස් කිරීම නිවැරදි කරගැනීමට හැකියාව තිබුණු නමුත් දිගින්දිගටම මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය (CECB) විසින් ප්‍රමාණපත්‍ර (BOQ) සකස් කිරීමේදී වැය විෂයයන් වල සියයට 50 සිට සියයට 300 දක්වා ඇස්තමේන්තු වල සත්‍ය අගයන් අතර වැඩ ඉටුකිරීමේදී විචලනයන් දක්නට තිබුණි.

(ඇ) 2010 වර්ෂයේදී ආරම්භ කර 2013 වර්ෂයේදී වැඩ නිමකලයුතු ඉදිකිරීම් ව්‍යාපෘති 12 ක් සමාලෝචිත වර්ෂය දක්වාම ආරම්භ කිරීමට කටයුතු නොකිරීමෙන් ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවායාම අවම කිරීම ගැටළු සහගත වේ.

4.8 **කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 213 න් පුරප්පාඩු 70 ක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ vi වන කොටසේ 33 වන වගන්තිය ප්‍රකාරව පත්කළ යුතු විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති තනතුර 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පුරප්පාඩුව පැවතිණි.

(ඇ) ලේඛකාධිකාරි තනතුර 2014 මාර්තු 12 දින සිට පුරප්පාඩුව පවතින අතර 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 37(1) වගන්තිය ප්‍රකාරව එම පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට විශ්වවිද්‍යාලය අපොහොසත්වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 113 න් තනතුරු 70 ක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අසමත් වී තිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලයේ පර්යේෂණාගාර 32 ක් ඇති නමුත් සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්මික කාර්ය මණ්ඩලයේ තනතුරු 12 න් තනතුරු 10 කම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අසමත් වී තිබුණි.

(ඊ) 2002 ජනවාරි 08 දිනැති අංක 794 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ දක්වා ඇති අවම සුදුසුකම්වලට පටහැනිව 2008 සැප්තැම්බර් 05 දිනැති අංක UGC/HR/1/2/452 දරන පත්වීම් ලිපිය අනුව ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි තනතුර සඳහා බඳවා ගැනීමට කටයුතු කර තිබුණි.

(උ) අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් කථිකාචාර්යවරුන් 05 දෙනෙකුගේ පත්වීම් ලිපිය ප්‍රකාරව පත්වීම ස්ථිර කිරීමට පත්වීම් දින සිට වසරක් ඇතුළත සම්පූර්ණ කළ යුතු ඉගැනීම් /ඉගැන්වීම් ක්‍රම ශිල්ප ඇතුළත් සේවක සංවර්ධන පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර නොතිබුණි.

(ඌ) 1982 අප්‍රේල් 06 දිනැති අංක 166 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ විධිවිධාන අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයට කථිකාචාර්යවරුන් පත් කිරීමට අදාලව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි කටයුතු කිරීමෙන් කථිකාචාර්යවරුන් සිව්දෙනෙකුට අදාල පත්වීම් බල රහිත විය.

(එ) විශ්වවිද්‍යාලයේ අනුමත සේවක සංඛ්‍යාවෙහි පොත් තබන්නා තනතුරක් අනුමත වී නොතිබුණ නමුත් 2014 ජූලි 24 දින අංක 638/2014 දරන ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව වර්තමානයේ විශ්වවිද්‍යාලය වෙත සේවා සපයන පෞද්ගලික ආයතනයෙන් පොත් තබන්නා තනතුර සඳහා සේවකයන් දෙදෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණි.

4.9 වාහන උපයෝජනය

වාහන සඳහා ඇතිකරගෙන තිබූ ගිවිසුම් අනුව මාසිකව ධාවනය කළයුතු කිලෝමීටර් ප්‍රමාණයට වඩා අඩුවෙන් ධාවනය කරනු ලබන කිලෝමීටර් ප්‍රමාණයටද ගෙවීම් කිරීමේ කොන්දේසියක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී වාහන 05ක් සම්බන්ධයෙන් ධාවනය නොවූ කි.මී. 29,897 ක් වෙනුවෙන් රු.914,878 ක මුදලක් ගෙවා තිබුණි.

05. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2002 මැයි 24 දිනැති අංක පිඑෆ්/පීඊ.21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2015 මාර්තු 31 දිනදීය.

5.2 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 – 2018 කාල පරිච්ඡේදයට අදාල සංයුක්ත සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති 21 ක් ආරම්භ කර නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගතව නොතිබුණු අතර ඉටුකරගත යුතු ඉලක්කයන්ගේ මූල්‍ය අගයන් දක්වා නොතිබුණු බැවින් ප්‍රගතිය ඇගැයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.

5.3 **ක්‍රියාකාරී සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය අනුව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ භෞතික ප්‍රගතිය මැන බැලීම සඳහා කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ඇ) සංයුක්ත සැලැස්මේ හා ක්‍රියාකාරී සැලැස්මේ භෞතික ප්‍රගතිය මැන බැලීම හා ඊට අදාල තීරණ ගැනීම සඳහා උපායමාර්ගික කළමනාකරණ හා සංවර්ධන කමිටුවක් පිහිටුවා තිබූ නමුත් එම කමිටුව මාස්පතා රැස්වී ප්‍රගති සමාලෝචනයක් කර නොතිබුණි.

5.4 **විගණන හා කළමනාකරණ කමිටු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 15 ඡේදය ප්‍රකාරව වර්ෂයකට අවම වශයෙන් විගණන කමිටු රැස්වීම් 04ක් පැවැත්විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) දැනට මිලදීගෙන ඇති පරිගණකගත ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීනව ක්‍රියාත්මක කිරීම, අනධ්‍යයන කාර්යමණ්ඩලයේ සියළු නිලධාරීන් වෙත රාජකාරි පැවරීමේ ලිපි නිකුත් කිරීම, විගණන විමසුම් ලේඛනය නඩත්තු කිරීම සහ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම සම්බන්ධයෙන් 32 වැනි විගණන කමිටුවේදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

5.5 **ප්‍රසම්පාදන සැලැස්ම**

විශ්වවිද්‍යාලය සතුව වෙබ් පිටුවක් හා ප්‍රමාණවත් තොරතුරු තාක්ෂණ පහසුකම් ඇති නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.8 මාර්ගෝපදේශය ප්‍රකාරව විද්‍යුත් ප්‍රසම්පාදන කටයුතු විද්‍යුත් මාර්ගයෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

5.6 **අයවැය ලේඛනමය පාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තුගත වියදම්, තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 13 ක සිට සියයට 61 ක් දක්වා වූ විචලනයක් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 07 ක් සඳහා වෙන්කර තිබුණ ප්‍රතිපාදනවලින් සියයට 15 ක සිට සියයට 91 ක් දක්වා වූ සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් සේවක සංවර්ධන ආයතනය හා උපාධි ලෝගුව මිලදී ගැනීම සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන අනුමත කර ගැනීමකින් තොරව පිළිවෙලින් රු. 2,782,153 ක හා රු. 94,500 ක වියදම් දරා තිබුණි.

5.7 **නොවිසඳී ඇති විගණන ඡේද**

2012 සැප්තැම්බර් 21 දින පැවැති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදුන් උපදෙස් අනුව අපජලය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීමට මේ දක්වා විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.

06. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ගබඩා පාලනය

(ඇ) මූල්‍ය කළමනාකරණය හා වියදම් පාලනය

(ඈ) මානව සම්පත් කළමනාකරණය

(ඉ) වාහන උපයෝජනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

23. විගණකාධිපති වාර්තාවට පිළිතුරු

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති

(අ) (i) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගිණුම් ගත කල යුතු වත්කම් අත්පත් කර ගැනීම සඳහා ලැබුණු රු. 187, 359,260 ක් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ගිණුම් ගත කර තිබුණි.	මහා භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ ලැබෙන මුදල් විශ්ව විද්‍යාලයේ සමුච්චිත අරමුදලට සහ දිගු කාලීන අදායම් යටතේ ගිණුම් ගත කිරීම දැක්වීම හේතුවෙන් මෙම අගය මූල්‍යයන ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත.
(ii) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති ස්ථාවර වත්කම් මිලදීගැනිමට අදාල මුදල් ගලායාම් රු. 158,236,832 ක් උපචිත පදනම මත ගිණුම් ගත කර තිබිණි.	මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ ආකෘතියට අදාලව මුදල් ගලා එම් හා ගලා යාම් නිවැරදිව දක්වා ඇත.
(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ ලිපි ද්‍රව්‍ය තොගය තුළ 2009 වර්ෂයේ මුද්‍රණය කරන ලද ප්‍රයෝජනයට ගත නොහැකි පිරිවැය රු. 116,895 ක්වූ ශිෂ්‍ය අත්පොත් 293 ක් ඇතුළත්ව තිබූ නමුත් එවැනි තොග අගය කිරීම සම්බන්ධව ගිණුම් ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.	මූල්‍ය වාර්තාවේ පිටු අංක 08 හි 2.1 යටතේ තොග අගය කිරීම් ප්‍රතිශතය හෙළිදරව් කර ඇති අතර ඒ අනුව අදාළ තොගය පිරිවැය මත ගණනය කොට ඇත.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) විශ්වවිද්‍යාලය විසින් උපචිත පදනම මත ගිණුම් පිළියෙල කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු වියදම් රු. 2,925,867 ක් හා ලැබිය යුතු ආදායම් රු. 266,104 ක් වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොතිබුණි.	සමාලෝචිත වර්ෂයට අදාල 2014.12.31 දිනට ගෙවීම් නොකරන ලද හදුනාගත් සියලු වියදම් උපචිත වියදම් ලෙසත් හදුනාගත් සියලුම ආදායම් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම් ගත කොට ඇත.
(ආ) ඉකුත් වර්ෂයේ ගෙවියයුතු බාහිර පාඨමාලා වියදම් වෙනුවෙන් රු. 345,000 ක අධි වෙන් කිරිමක් සිදු කර තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාල රු. 1810,70 වියදම අධි වෙන් කිරිමෙන් ලියාහැර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ වියදම සම්බන්ධව හෙළිදරව් කිරිමක් සිදුකර නොතිබුණි.	එකග වෙමි. හෙළි දරව් කර නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඇ) පුනරාවර්තන වැය විෂයන්ගෙන් මිලදී ගත් එකතුව රු. 305,023 ක්වූ ප්‍රාග්ධන භාණ්ඩ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	ප්‍රාග්ධන භාණ්ඩ දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.
2.2.3 නොසැසඳු පාලනගිණුම් සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ උපලේඛන සැසඳීමේදී ලැබිය යුතු ශිෂ්‍යාධාර හා ලැබිය යුතු මහපොළ අතර පිළිවෙලින් රු. 660,671 ක හා රු. 765,100 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද ඉකුත් වර්ෂයේ සිට ඉදිරියට ගෙනා හඳුනා නොගත් ලැබිය යුතු ශිෂ්‍යාධාර රු. 170,321 ක් ඇතුලත්ව තිබු බව නිරීක්ෂණය විය.	මෙම වෙනස අදාල උප ලේඛන සමග සැසඳීම් කොට නිවැරදි කිරීමට කටයුතු කරමි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පහත සඳහන් එකතුව රු. 4,408,295, ක් වටිනා ගිණුම් විෂයයන් 04 ක් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	කාල විශ්ලේෂණ කේවල ශේෂ ලැයිස්තු තැන්පත් ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

ගිණුම්විෂයය	**වටිනාකම**	**ඉදිරිපත් නොකළ සාක්ෂි**
i ආපසු ගෙවිය යුතු තැන්පත්	1,997,840	i කාලවිශ්ලේෂණ
ii ආපසු ගෙවිය යුතු ආරක්ෂක තැන්පත්	647,953	ii.කේවල ශේෂ ලැයිස්තුව
iii පොදු තැන්පත්-පුනරාවර්තන	1,524,607	iii.තැන්පත් ලේඛන
පොදු තැන්පත්-ප්‍රාග්ධන	237,895	
එකතුව	**4,408,295**	

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 ජනවාරි සිට ජූලි දක්වා කාලය වෙනුවෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකු වෙත ගෙවා තිබුණු රු. 93,546ක පර්යේෂණ දීමනා අයකරගෙන නොතිබුණි.	අදාල මුදල ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලය වෙත පහත සඳහන් පරිදි සිහිකැදවීම් පත් යවා ඇත. එම මුදල අයකර ගැනීමට කටයුතු කරමි. 1. 2013 දෙසැම්බර් 05 2. 2014 අගෝස්තු 08 3. 2015 මැයි 11
(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 7,179,806ක් වූ ආපදා ණය ශේෂය තුළ 2007 හා 2008 වර්ෂවලදී නිලධාරින් 02 දෙනෙකු වෙත ලබාදුන් රු. 165,183ක ආපදා ණය ශේෂයන් අයවීම අත්හිටවී තිබුණි.	ආචාර්ය සිවගුරුනාදන් මහතාගෙන් අයවිය යුතු රු. 1682.69 මුදල නියමිත පරිදි පියවීම් කොට ඇති අතර එස්.සි.වීරසූරිය මහත්මියගේ (මියගිය) අයවිය යුතු මුදල ලබා ගැනීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත දන්වා ඇත.
(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 96,000 ක්වූ උත්සව අත්තිකාරම් ණය ශේෂය තුළ 2010,2011 හා 2013 අප්‍රේල් මාස වලදී නිලධාරින් 03 දෙනෙකු වෙත ලබාදුන් රු. 10,000 ක උත්සව අත්තිකාරම් ණය ශේෂයන් අයවීම අත්හිටවී තිබුණි.	නිරවුල් කිරීමට අදාල පියවර ගැනීමට දැනටමත් කටයුතු කර ඇත.
(ඈ) 2006 වර්ෂයේ සිට 2015 දක්වා කාලය තුළ විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු ඉටුකරන ලද මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට (CECB) ගෙවිය යුතු රු. 61,989,351 ක ප්‍රමාණයක් නිරවුල් කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නෙතිබුණි.	ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය ස්ථාපිත කිරීම් ව්‍යාපෘති අදියර II යටතේ ඉදිකිරීම් කරන ලද උප ව්‍යාපෘතින්හි රඳවා ගැනිම් මුදල් මේ යටතේ දක්වා ඇති අතර රඳවා ගැනීම් මුදල් නිදහස් කිරීමට අදාල කොන්දේසි සම්පූර්ණ වූ වහාම එම මුදල් නිදහස් කිරීමට කටයුතු කරමි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම
පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය

නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**	
අ) 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනත		
(i) 37. (1) වගන්තිය	සංයුතිය නියම කළ තෝරාගැනිමේ කමිටුවක නිර්දේශ මත පාලක සභාව විසින් විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරි පත් කළ යුතු නමුත් පාලක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව උපකුලපතිවරයා විසින් පැවරුම් පදනම මත විශ්‍රාමික ලේඛකාධිකාරිවරයකු එම තනතුර	ලේඛකාධිකාරි, නියෝජ්‍ය ලේඛකාධිකාරි සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි තනතුරු 2ක් පුරප්පාඩු පැවතීම හේතුකොට ගෙන ස්ථිර ලේඛකාධිකාරිවරයා පත් කරන තෙක් විශ්ව විද්‍යාලයේ පරිපාලන කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමේ අරමුණින් වෙනත් රාජ්‍ය විශ්ව විද්‍යාල කිහිපයක ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියකු ලෙස සේවය කරන ලද අත්දැකිම් බහුල නිලධාරියකු පැවරුම් පදනම මත ලේඛකාධිකාරි ලෙස පත්කොට

	සඳහා පත් කර තිබුණි.	ඇත. ස්ථිර ලේඛකාධිකාරිවරයකු පත්කිරීමට අදාල කටයුතු සිදුකරමින් පවතින බවද වැඩිදුරටත් දන්වමි.
(ii)108.(3)(2) වගන්තිය	විගණකාධිතිවරයාගේ වාර්තාව එවීමෙන් පසු මාස තුනක් ඇතුළත, ඒ වාර්තාවෙහි පෙන්නුම් කරන ලද කරුණු සම්බන්ධයෙන් ගන්නා ලද හෝ ගැනීමට යෝජිත පියවර විගණකාධිපතිවරයා වෙත දැන්විය යුතු නමුත් 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.	විගණාකාධිපති වාර්තාව සම්බන්ධයෙන් ගන්නා ලද යෝජිත පියවර සම්බන්ධ වාර්තාවක් කඩිනමින් විගණකාධිපති වෙත ලබා දීමට කටයුතු කරමි.

(ආ) 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය	සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	වාර්ෂික කෙටුම්පත් වාර්තා සකස් කර ඇති අතර, විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ඇ) 1985 අංක 01 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතින් සංශෝධිත 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වගන්තිය හා 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත	විධිවිධාන ප්‍රකාරව අවුරුදු 02 කට වැඩි කාලයක් තිස්සේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල රාජකාරි ඉටුකරනු ලබන පුහුණුලාභින් 28 දෙනෙකු වෙනුවෙන් දායක මුදල් අරමුදල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.	රජයේ අනුමත චක්‍රලේඛ විධිවිධාන අනුව පුහුණුවීම් සඳහා අවස්ථාව ලබා දී ඇති අතර පුහුණුලාභින් වෙනුවෙන් දායක මුදල් ගෙවීම සම්බන්ධයෙන් අණපනත් පරිදි උපදෙස් ලබා දෙන ලෙස මේ වන විට බදුල්ල කම්කරු කොමසාරිස් වෙත දන්වා යවා ඇත

(ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 2,100,000,044 ක් වටිනා දේපල පිරියත හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කරන බව දන්වමි.

(ඉ) 2003 ජුනි 03 දිනැති අංක පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.1 හා 7.2 වගන්ති	විශ්ව විද්‍යාල ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබිණි.	ඉදිරියේදි ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අත්පොත් පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු කරමි.

(ඊ) 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත 2006 අංක 12 දරණ මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 03 වගන්තිය	ගෙවීම් වටිනාකම රු. 25,000කට වැඩි ගෙවිම් මත රු.25ක මුද්දර ගාස්තු අයකරගත යුතු නමුත් නියැදි පරීක්ෂාවට අනුව අවස්ථා 16 කදී එකතුව රු. 1,019,661 ක් ගෙවීම් සම්බන්ධයෙන් නියෝග අනුව කටයුතු කර නොතිබුණි.	රු. 25,000.00 කට වැඩි ගෙවීම් මත රු. 25 ක මුද්දර ගාස්තු අය කිරිම ආචාර්යයවරුන් වෙනුවෙන් කල විභාග ගාස්තු ගෙවිමකදි මග හැරි ඇත. ඉදිරියට රු. 25000/= කට වැඩි සෑම ගෙවිමකින්ම මුද්දර ගාස්තු අය කිරිමට කටයුතු කරනු ලැබේ.
(උ) 2011 පෙබරවාරි 21 දිනැති අංක 449 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය	කාර්යය පැවරුම් පදනම මත වූ පත්වීම්, දින 45 ක් නොඉක්මවන හා පැවරුමකට ගෙවිය හැකි උපරිම මුදල රු. 30,000 ක් වුව ද ඊට පටහැනිව කාර්ය පැවරුම් පදනම මත විශ්‍රාමික නිලධාරින් 03 දෙනෙකු වෙත චක්‍රලේඛ ප්‍රතිපාදන සීමාව ඉක්මවා ගෙවන ලද රු. 718,539 ක් සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබාගෙන නොතිබුණි.	අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා පැවරුම් පදනම මත අදාල නිලධාරීන් බඳවා ගෙන ඇති අතර පාලක සභාව වෙත පවරා ඇති බලතල යටතේ අදාළ දීමනා තීරණය කොට ඇත.

(ඌ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උපාධි අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 01 වන පරිච්ඡේදය හා මුදල් රෙගුලාසි 758	සමාලෝචිත වර්ෂය සඳහා නියමිත කාල පරතර තුළදී වාර්ෂික සමීක්ෂණයට අමතරව ගබඩා සමීක්ෂණ සිදුකර නොතිබුණි.	එකග වෙමි. ඉදිරියේදි මේ සම්බන්ධව ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 01 වන පරිච්ඡේදය හා මුදල් රෙගුලාසි 758 අනුව ගබඩා සමීක්ෂණ කටයුතු කිරීමට කටයුතු කරමි.

(එ) 2010 පෙබරවාරි 05 දිනැති අංක 920 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 5 (viii) ඡේදය	වැටුප් පරිවර්තන සිදුවන අවස්ථාවන්හිදී ආචාර්යවරුන් 26 දෙනෙකුට අදාල ඇප බැඳුම්කරෙ සංශෝධනය කර නොතිබුණි.	පිළිගනිමි. ඇප බැඳුම්කර සංශෝධනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. පසුගිය කාල වකවානුව තුල මානව සම්පත් අංශය සඳහා පළපුරුදු කාර්ය මණ්ඩලයක් අනුයුක්තව නොසිටි අතර රාජකාරි කටයුතු පුහුණු වන්නන් හා මෙහෙයුම් සහකාර වරුන් වෙතින් ඉටුකරවා ගෙන ඇත. එබැවින් මෙවැනි කාර්යයන් සාර්ථකව හරියාකාරව ඉටුකර ගැනීමට නොහැකි වී ඇත.

(ඒ) 2013 අගෝස්තු 29 දිනැති අංක 12/2013 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ආයතනික චක්‍රලේඛය	ජ්‍යෙෂ්ඨ නිලධාරින්ට හිමි නිවාසවල හා තනිකඩ බද්ධ නිවාසවල පදිංචි නිලධාරින්ගෙන් නිවාස කුලිය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.	අදාල ආයතන චක්‍ර ලේඛනයන්ට අනුව කටයුතු කිරීමට එකඟ වෙමි.
(ඔ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ v පරිච්ඡේදයේ 7.6 ඡේදය	බැඳුම්කර හා ගිවිසුම් කොන්ත්‍රාත් කඩකිරිම සම්බන්ධයෙන් ආචාර්යවරුන් දෙදෙනෙකුගෙන් රු. 8,220,772 ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතුව තිබුණි.	ඉහත ආචාර්යවරුන් පිළිබඳව තොරතුරු ලබා දෙන්නේ නම් මේ සම්බන්ධව පිළිතුරු ලබා දිය හැක. දැනට මානව සම්පත් අංශය මගින් එම්.ඒ.පි.එන්. පෙරේරා සහ ඊ.කේ.එන්.ඩී. ප්‍රනාන්දු ආචාර්යවරුන් සඳහා අදාල ගිවිසුම් මුදල් ගෙවන ලෙස ලිපි මගින් යවා ඒ පිළිබඳව කටයුතු සිදු කෙරෙමින් පවති. තවද දැනට මානව සම්පත් අංශයේ සේවය කරන සියලු දෙනා නවක නිලධාරින් බැවින් තොරතුරු සොයා ගැනීමේ අපහසුතාවයක් පවති.

03 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 59,812,116 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 123,412,661ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 63,600,545 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.	ඉකුත් වර්ෂයට සාපෙක්ෂව සමාලෝචිත වර්ෂයේ ඉලක්ක ගත විශ්ව විද්‍යාල මෙහෙයුම් කටයුතු ඉටු කර ගැනීමට හැකිවූ බැවින්, මෙම වර්ධනයට හේතු වී ඇත.

04. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

(අ) සමාලෝචිත වර්ෂය තුළ ශිෂ්‍යයින් 1900 දෙනෙකුගේ අධ්‍යයන කටයුතු වෙනුවෙන් දරණ ලද පිරිවැය රු. 457,802,863 ක් වූ අතර ඒක ශිෂ්‍ය පිරිවැය රු. 240,949 ක් විය. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 1423 දෙනෙකුගේ අධ්‍යයන පිරිවැය රු. 401,635,931 ක් වූ අතර, ඒක ශිෂ්‍ය පිරිවැය රු. 282,246 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු. 41,297 කින් අඩු වී තිබුණි.	එකඟ වෙමි.
(ආ) සමාලෝචිත වර්ෂයේ දිවයිනේ විශ්වවිද්‍යාවල 1:17 ක්වූ සාමාන්‍ය කථිකාචාර්ය ශිෂ්‍ය අනුපාතයට සාපේක්ෂව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය ශිෂ්‍ය අනුපාතය 1:16 ක් විය.	සංවර්ධනය වෙමින් පවතින විශ්වවිද්‍යාලයක් සහ අගනුවරින් දුර බැහැරව පිහිටි විශ්වවිද්‍යාලයක් නිසා මෙම තත්වය ඇති වී ඇත.
(ඇ) සංයුක්ත සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය සඳහා සිසුන් 605 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් කර තිබූ නමුත් සිසුන් 507 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණි. ඒ අනුව අපේක්ෂිත සංඛ්‍යාවෙන් සිසුන් 98 ක් එනම් 16% ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.	විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ජාතික පදනම මත සිසුන් බඳවා ගන්නා අතර ලියාපදිංචි වන සිසුන් හට ස්ථාන මාරු ලැබීමත් සහ ඉදිරි විශ්වවිද්‍යාල උසස් ප්‍රතිඵල අපේක්ෂාවෙන් ලියා පදිංචි නොවීමත් මේ තත්වය උද්ගත වී ඇත.
(ඈ) 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ස්ව ආදායම් ඉපයීමේ පාඨමාලා පැවැත්වීමෙන් ඉපයූ ආදායම 37% කින් අඩු වී තිබුණි.	දුරස්ථ අධ්‍යයන ඒකකය යටතේ නව පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම් සකස් කොට ඇති බව දන්වමි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 05/0183/035/001 යටතේ ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා 2008 පෙබරවාරි 10 දින පැවැත්වුණ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ඉඩම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාලව ගත් තීරණය අනුව ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සඳහා දැනට	මේ සම්බන්ධව අධිකරණමය කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතින බැවින් එය අවසන් වූ වහාම නීත්‍යානුකූලව ඉඩම් වල අයිතිය විශ්ව විද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු කරමි.

වෙන්කරනු ලැබ ඇති හෙක්ටයාර් 30,9667 ක ඉඩම්වල අයිතිය විශ්ව විද්‍යාලය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	

4.3 අරමුදල් උපයෝජනය

(අ) සමාලෝචිත වර්ෂයේ සංශෝධිත අයවැය ඇස්තමේන්තුවෙන් මූලධන වියදම් සඳහා ලබාදී තිබුණ රු. 230,000,000 ක්වූ ප්‍රතිපාදනයෙන් රු. 71,763,168 ක් ඉතිරිකර තිබුණි. එය සමස්ථ මූලධන ප්‍රතිපාදනයෙන් සියයට 31 කි.	2014 වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා සමාලෝචිත වර්ෂය සඳහා ගැනීමට නියමිතව තිබූ ස්ථාවර වත්කම් සඳහා භාණ්ඩ මිලදි ගැනීම් පත්‍ර යවා තිබුනද අදාල කාල සීමාව තුලදි සැපයුම් කරුවන් විසින් භාණ්ඩ සැපයීම අපොසත් වූ බැවින් ප්‍රතිපාදන නිදහස් නොකිරීම මත මෙම ඉතිරිය සිදු වී ඇත.
(ආ) තොරතුරු තාක්ෂණ සංවර්ධනය, ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්, ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය, ව්‍යාපාර උපදේශන ඒකකය හා නවෝත්පාදන හා භාණ්ඩ යන ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක් සඳහා වෙන්කර තිබුණ රු.7,000,000 මුළු ප්‍රතිපාදනයම වියදම් නොකර ඉතිරි කර තිබුණි.	සැලසුම් ගත වැඩසටහන් කල් දැමීම හේතු කොට ගෙන මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත.
(ඇ) පර්යේෂණ දිරිමත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ වර්ෂයේදී අයවැය ගත මූලධන ප්‍රතිපාදනය වූ රු. 25,000,000 කින් උපයෝජනය කර තිබුනේ රු. 554,266 ක් පමණි. ඒ අනුව රු. 24,445,734 ක ප්‍රතිපාදන ඉතිරියක් වී තිබූ අතර එය ප්‍රතිපාදනයෙන් සියයට 98 ක් විය.	අයවැය ගත මූල ධන ප්‍රතිපාදන 10% පර්යේෂණ දිරිමත් කිරීම සඳහා වෙන් කල නමුත් සමාලෝචිත වර්ෂයේදි යෝජිත පර්යේෂණයන් කිරීමට අපොහොසත් වීම මත මෙම ප්‍රතිපාදන ඉතිරියක් දක්නට ඇත. නමුත් ඌණ උපයෝජනය කර ඇති ස්ථාවර වත්කම් සඳහා මෙම ප්‍රතිපාදන උපයෝජනය කර ඇත.
(ඈ) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් බදුල්ල විසින් පටක රෝපණ ව්‍යාපෘතිය සඳහා ලබා දෙන ලද රු. 3,323,000 ක් පොදු තැන්පත් ප්‍රාග්ධන ගිණුමට බැරකර තිබූ නමුත් 2015 මාර්තු 31 දින වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය භාණ්ඩ හා උපකරණ මිලදි ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු කෙරෙමින් පවතින අතර, ඉදිරියේදි මෙහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය බදුල්ල දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

4.4 ආර්ථික නොවූ ගනුදෙණු

සමාලෝචිත වර්ෂයේ සැම මසකම බාහිර පාඨමලා වලින් ඉපයූ ආදායමෙන් රු. ලක්ෂ 10 ක මුදලක් ජංගම ගිණුමේ තිබූ නමුත් එය ආයෝජනය කර පොළියක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ස්ථාවර තැන්පතු සඳහා මුදල් යෙදවීමට කටයුතු කරමි.

4.5 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 ජුනි 30 දින මිලදීගෙන තිබූ රු. 322,560 ක් වටිනා ගිනි ආරක්ෂණ සේප්පු 05 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනටද ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව තිබුණි.	මෙම නිරීක්ෂණය පිළිගන්නා අතර අදාළ සැපයුම්කරුගේ එකඟතාවය මත ගිනි ආරක්ෂණ සේප්පු යකඩ අල්මාරි සමඟ හුවමාරු කර ගැනීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.
(ආ) 2012 වර්ෂයේදී ඉංජිනේරු වැඩහල සඳහා මිලදී ගෙන තිබූ රු. 14,060,480 ක් වටිනා 3-Axis CNC යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනටද ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව තිබුණි.	මේ සම්බන්ධව අංශ ප්‍රධාන හා පීඨාධිපති විමසා අදාල උපකරණ පාවිච්චි කිරීමට උපදෙස් ලබා දී ඇති අතර එම යන්ත්‍රය ප්‍රයෝජනයට ගනු ලබන බවද දන්වමි.
(ඇ) බාහිර පාඨමාලා අංශයට රු. 1,117,933ක වටිනාකමැති ස්ථාවර වත්කම් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ "HETC" ව්‍යාපෘතිය හරහා පිරිනමා තිබූ නමුත් එම වත්කම් ඵලදායි ලෙස බාහිර පාඨමාලා අංශයේ අරමුණු ඉටුකර ගැනිමට උපයෝජනය කර නොමැති බව දක්නට ලැබිණි.	විශ්ව විද්‍යාලයේ ප්‍රධාන ගබඩාව සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කර ඇති අතර දැනට ගබඩාවේ කටයුතු පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බාහිර පාඨමාලා අංශය සඳහා වෙන් කර ඇත. එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කොට බාහිර පාඨමාලා අංශයේ කටයුතු සඳහා වෙන් කිරීමට අදාල විධිවිධාන යොදා ඇත.
(ඈ) විශ්වවිද්‍යාලයේ මූල්‍ය අංශයේ පරිපාලන කටයුතු පහසුකර ගැනිමට 2013 වර්ෂයේ මිලදී ගත් රු. 222,768 ක් වටිනා ගිණුම්කරණ පරිගණක මෘදුකාංගය වර්තමානයේ චෙක්පත් මුද්‍රණය සඳහා පමණක් යොදා ගන්නා බව දක්නට ලැබිණි.	මෙම මෘදුකාංගයේ සමහර ගිණුම් කරන පද්ධති මෙහෙයවීම තුළ පවතින අඩුපාඩු හේතුවෙන් මෙය යාවත්කාලීන කිරීම අපහසු බවත්, මෙම මෘදුකාංගය මිලදී ගත් ආයතනය වෙත මේ බව දැනටමත් දන්වා ඇති අතර මෙය සකස් කර ගැනීමෙන් පසු මූල්‍ය අංශයේ පරිපාලන කටයුතු පහසුකර ගැනිමට බලා පොරොත්තු වෙමි.

4.6 දෘෂ්‍ය අක්‍රමිකතා

(ආ) සමාලෝචිත වර්ෂයේ පැවැත්වූ උපාධි ප්‍රධානෝත්සවය ඡායාරූප ගත කිරිම හා වීඩියෝගත කිරිමට අදාල සැපයුම්කරු තෝරාගැනීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.5, 5.2.1(අ), 6.3.2, 6.3.3, 6.3.3.1(අ) මාර්ගෝපදේශයට පටහැනිව කටයුතු කර තිබුණු අතරම මාර්ගෝපදේශයේ 1.21 හි සඳහන් අරමුණු හා මාර්ගෝපදේශයේ 1.4 හි සඳහන් ආචාරධර්ම උල්ලංඝණය කර තිබුණි. එමෙන්ම තෝරාගත් සැපයුම්කරු විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් අනුව "10× 12" ප්‍රමාණයේ ඡායා	මෙම සේවාව සැපයීමට අදාලව පහසුකම් සැපයීම පමණක් විශ්ව විද්‍යාලය මගින් සිදු කර ඇත. අදාල සේවාව ලබා ගැනීම ශිෂ්‍යයන් ගේ අභිමතය පරිදි සිදු කර ඇත.

රූපයක් රු. 100 ක් බව සඳහන් වන නමුත් උපාධි අපේක්ෂකයන් වෙත ඡායාරූපයක් රු. 336ක් වැනි මුදලකට අලෙවි කර ඇති බව විගණනයේදී තහවුරු විය. ඒ අනුව රු. 104,784 ක් අයථා අන්දමින් උපයා ගැනීමට විශ්වවිද්‍යාලය විසින් ආධාර අනුබල ලබාදී තිබුණි. තවද මේ සම්බන්ධයෙන් හිමිකම හා අයිතිය විශ්වවිද්‍යාලය සතු වන නමුත් එම අයිතිය සම්බන්ධවව විශ්වවිද්‍යාල අරමුදලට කිසිදු අයකිරීමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	

4.7 කොන්ත්‍රාත් පාලනයේ අඩුපාඩු

(අ) 2008 වර්ෂයේදී ඇගළුම් කර්මාන්ත ගොඩනැගිල්ල සඳහා රු. 41,247,644 ක් වැයකර නවීකරණය කරන ලද නමුත් වහලින් ජලය කාන්දු වීම හේතුවෙන් සිවිලිම අබලන් වෙමින් පැවතුණ අතර යථෝක්ත ගොඩනැගිල්ලේ වහල සමාලෝචිත වර්ෂයේ ජනවාරි - අප්‍රේල් කාල පරිච්ඡේදය තුළ පුනරුත්ථාපනය කිරීමට කටයුතු කර නොතිබුණි.	වාර්ෂික සැලැස්මේ වෙන්කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවිය නොහැකි විය. මේවන විට ව්‍යාපෘතිය සඳහා උපදේශකවරයකු පත් කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.
(ආ) ඉදිකිරීම් ව්‍යාපෘති සැලසුම් සකස් කිරීමෙන් පසුව අවශ්‍ය ප්‍රමාණපත්‍ර (BOQ) සකස් කිරීම නිවැරදි කරගැනිමට හැකියාව තිබුණු නමුත් දිගින් දිගටම මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශය (CECB) විසින් ප්‍රමාණපත්‍ර (BOQ) සකස් කිරීමේදී වැය විෂයයන් වල විශාල විචලනයක් නිරූපණය වී තිබුණි. සමහර වැය විෂයයන් 50% සිට 300% දක්වා ඇස්තමේන්තු වල සත්‍ය අගයන් අතර වැඩ ඉටුකිරීමේදී විචලනයන් දක්නට තිබුණි.	මේ සම්බන්ධව උපදේශක ආයතනයට දන්වා ඇති අතර සාධාරණ හේතුවකින් තොරව විචල්‍යයන් සඳහා අනුමැතිය ලබා දීම හෝ ගෙවීම සිදු නොකිරීමට කටයුතු කර ඇත.
(ඇ) 2010 වර්ෂයේ වැඩ ආරම්භකර 2013 වර්ෂයේදී වැඩ නිම කල යුතු ඉදිකිරිම් ව්‍යාපෘති 12ක් සමාලෝචිත වර්ෂයේ දක්වාම ආරම්භ කිරිමට කටයුතු නොකිරීමෙන් ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා යාම අවම කිරිම ගැටළු සහගත වේ.	අදාල ව්‍යාපෘති වාර්ෂික සැලැස්මට ඇතුලත් කර තිබූ අතර නිදහස් කරනු ලැබූ ප්‍රතිපාදන වලට සාපෙක්ෂව සහ අදාල ව්‍යාපෘතින්හි අත්‍යවශ්‍යතාවය මත ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබීය.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 213 න් පුරප්පාඩු 70 ක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීමට අදාල පුවත්පත් දැන්වීම් මේ වන විට පල කර ඇති අතර ඔවුනගේ සුදුසුකම් පරීක්ෂා කර බලා බඳවා ගැනීම් සඳහා අවශ්‍ය සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ කටයුතු සිදු කෙරෙමින් පවති. මීට අමතරව සහයක මහාචාර්ය තනතුරු සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර කොමිෂන් සභා චක්‍ර ලේඛ 916 අනුව සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ කටයුතු සඳහා ක්‍රියාත්මක වෙමින් පවති. තවද, විශ්වවිද්‍යාල පද්ධතියේ බාහිර කථිකාචාර්යවරු මඟින්ද සේවා අවශ්‍යතා ලබා ගන්නා අතර තාවකාලික කථිකාචාර්ය හා තාවකාලික ප්‍රදර්ශක යන තනතුරු මඟින්ද සේවා ලබා ගැනීමට කටයුතු කර ඇත.
(ආ) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ vi වන කොටසේ 33 වන වගන්තිය ප්‍රකාරව පත්කල යුතු විශ්වවිද්‍යාලයේ පුස්තකාලාධිපති තනතුර 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පුරප්පාඩුව පැවතුණි.	පුස්තකාලාධිපති තනතුර සඳහා බඳවා ගැනීම් සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.
(ඇ) ලේඛකාධිකාරි තනතුර 2014 මාර්තු 12 දින සිට පුරප්පාඩුව පවතින අතර 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 37(1) වගන්තිය ප්‍රකාරව එම පුරපුපාඩුව සම්පූර්ණ කිරිමට විශ්වවිද්‍යාලය අපොහොසත්වී තිබුණි.	ලේඛකාධිකාරි තනතුර සඳහා 2014.07.20 වන දින පලවූ පුවත්පත් දැන්වීමට අනුව පැවැත්වූ සම්මුඛ පරික්ෂණයේ සුදුස්සෙකු තෝරා ගැනීමට නොහැකි වූ අතර නැවත දැන්වීම පල කිරීමට පාලක සභාව තීරණය කර ඇත.
(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 113 න් තනතුරු 70ක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය අසමත් වී තිබුණි.	විශ්වවිද්‍යාල ආරම්භක අවස්ථාවේ ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් මත අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමෙන් තොරව කාර්මික විද්‍යාලවල පුහුණුවන්නන් හා විශ්වවිද්‍යාලය මඟින් නිර්මාණය කරන ලද මෙහෙයුම් සහකාර තනතුර දැරූවන් මඟින් කාර්යාල පරිපාලන කටයුතු ඉටුකරගෙන ඇති අතර මේ වන විට ඖෂධවේදී ,නේවාසිකාගාර පාලක /පාලිකා ,වැඩ පරික්ෂක සිවිල් , පරිගණක යෙදුම් සහකාර යන තනතුරු පිරවීමට කටයුතු සිදුකර ඇත.
(ඉ) විශ්වවිද්‍යාලයේ පර්යේෂණාගාර 32ක් ඇති නමුත් සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්මික කාර්ය මණ්ඩලයේ තනතුරු 12න් තනතුරු 10ක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අසමත් වී තිබුණි.	කාර්මික කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමක් සිදුකරනු ලැබූ අතර ඒ සඳහා ලද ප්‍රතිචාර අවමවීම හේතුවෙන් කොමිෂන් සභා චක්‍ර ලේඛ 876 අනුව අදාල නාම ලේඛනය ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත.
(ඊ) 2002 ජනවාරි 08 දිනැති අංක 794 දරන	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි තනතුරට අදාල පත්කිරීම විශ්ව විද්‍යාල පනතේ 71 හා 72 වගන්ති පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ දක්වා ඇති අවම සුදුසුකම් වලට පටහැනිව 2008 සැප්තැම්බර් 05 දිනැති අංක UGC/HR/1/2/452 දරන පත්වීම් ලිපිය අනුව ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි තනතුර සඳහා බඳවා ගැනීමට කටයුතු කර තිබුණි.	කොමිෂන් සභාව සතු බලයකි. එම පත්කිරීම සිදුකර ඇත්තේ ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය නොව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව බව දන්වමි.
(උ) අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් කථිකාචාර්යවරුන් 05 දෙනෙකුගේ පත්වීම් ලිපිය ප්‍රකාරව පත්වීම් ස්ථිර කිරිමට පත්වීම් දින සිට වසරක් ඇතුළත සම්පූර්ණ කළ යුතු ඉගැනීම්/ ඉගැන්වීම් ක්‍රම ශිල්ප ඇතුළත් සේවක සංවර්ධන පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර නොතිබුණි.	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කිහිපදෙනෙකු ආරම්භක අවස්ථාවේ අධ්‍යයන කටයුතු වල නියැලිම හේතුවෙන් අදාළ පාඨමාලාව නියමිත කාලසීමාවේදි සම්පූර්ණ කල නොහැකි විය. කෙසේ වුවද පසු කාලිනව එම අධ්‍යයන කාර්ය මණ්ඩල සමාජිකයින් පාඨමාලාව හදාරා ඇත.
(ඌ) 1982 අප්‍රේල් 06 දිනැති අංක 166 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ විධිවිධාන අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයට කථිකාචාර්යවරුන් පත් කිරීමට අදාලව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි කටයුතු කිරීමෙන් කථිකාචාර්යවරුන් සිව්දෙනෙකුට අදාල පත්වීම් බල රහිත විය.	1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතට අනුව විශ්ව විද්‍යාල ලේඛකාධිකාරිවරිය සනාතන සභාවේ සහ පාලක සභාවේ නිල ලේඛකම්වරයා වේ. එසේ වුවද සියලුම තේරීම් මණ්ඩලයන්හි ලේඛකාධිකාරිවරිය ඇයගේ නියෝජිතයන් සහභාගි වී ඇති අතර, එහිදි ලේකම් ලෙස සටහන් නොකිරීම නිසා පමණක් මෙය සිදු වී ඇත.
(එ) විශ්වවිද්‍යාලයේ අනුමත සේවක සංඛ්‍යාවෙහි පොත් තබන්නා තනතුරක් අනුමත වී නොතිබුණු නමුත් 2014 ජූලි 24 දින අංක 638/2014 දරන ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව වර්තමානයේ විශ්වවිද්‍යාලය වෙත සේවා සපයන පෞද්ගලික ආයතනයෙන් පොත් තබන්නා තනතුර සඳහා සේවකයන් දෙදෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණි.	හදිසි සේවා අවශ්‍යතාවය මත විශ්වවිද්‍යාලය වෙත සේවා සපයන අබාන්ස් ආයතනය මගින් සේවකයින් දෙදෙනෙකු බඳවා ගත් බවට එකඟවන අතර ගිණුම් නිසි පරිදි කලට වේලාවට ඉදිරිපත් කිරීම සඳහා හදිසි අවශ්‍යතාවයන් සේ සලකා මෙම පොත් තබන්නන් දෙදෙනාගේ සේවය ලබා ගත් අතර පුවත්පත් දැන්වීමක් පල කර පොත් තබන්නන් දෙදෙනෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවති. ආරම්භක අවස්ථාවේ ප්‍රතිපත්ති තීරණයන් මත අනධ්‍යයන කාර්ය මණ්ඩල කටයුතු සිදු කර ගනු ලැබුවේ සේවා සපයන්නන් මගිනි.

4.9 වාහන උපයෝජනය

(අ) වාහන සඳහා ඇතිකරගෙන තිබු ගිවිසුම් අනුව මාසිකව ධාවනය කළයුතු කිලෝමීටර් ප්‍රමාණයට වඩා අඩුවෙන් ධාවනය කරනු ලබන කිලෝමීටර් ප්‍රමාණයටද ගෙවීම් කිරිමේ කොන්දේසියක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී වාහන 05ක් සම්බන්ධයෙන් ධාවනය නොවූ කි.මි. 29,897 ක් වෙනුවෙන් රු. 914,878 ක මුදලක් ගෙවා තිබුණි.	3000km ක මාසික ධාවන දුරක් සලකා ටෙන්ඩර මිල ගණන් කැඳවා ඇත. එහිදී ඉන්ධන, මාසික නඩත්තුව, රක්ෂණය හා රියදුරු වේතනය යන සියල්ල පදනම් කර ගන්නා ලදී. එසේම මාසිකව 3000km දිවිය නොහැකි විට උක්ත මිල ගෙවීම සේවා ලාභියාට මූල්‍යමය පාඩුවක් සිදුවන බැවින් 3000km අඩුවෙන් ධාවනය වන විට එම දුර සඳහා (3000km හා සත්‍ය දුර අතර වෙනස) මිලක් ද ලබා ගන්නා ලදී. මෙම මිල සත්‍ය වශයෙන් ම රියැදුරු වේතනය, මාසික නඩත්තු, රක්ෂණය වැනි කරුණු (ඉන්ධන හැර) වෙනුවෙන් අය කරන මිලකි.

	එසේම උක්ත මිල කැදවනු ලැබුවේ සමහර මාස සඳහා 3000km දුරක් ධාවනය නොවන බැවිනි. වසරක් සැලකීමේ දී අප්‍රේල් මාසය, විභාග පවත්වනු ලබන මාස වැනි කාල වකවානු තුල අඩු ධාවනය දුරක් ඇති බව දැක්විය හැක. එසේම එම කාලය තුල 2500km වැනි ධාවන දුරක් ඇති බැවින් වාහන ඉවත් කිරිමක් ද සිදු කල නොහැක. තවද මෙම අඩු ධාවනය සිදුවනු ලබන්නේ (Crew Cab) රථය බවද පෙන්වාදිය හැක. මන්ද එම රථයෙහි මාසික ධාවන දුර 2000kmකී. මෙම රථයට පැවරී ඇති වැඩ කොටස සමහර මාස වල අවම අගයක් ගනී. (ජලය සැපයීම වැනි කටයුතු) එහෙයින් මෙවැනි වෙනසක් ඇතිවිය හැකි බව දන්වමි.

05. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2002 මැයි 24 දිනැති අංක පී එෆ්/ පී. ඊ. 21 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2015 මාර්තු 31 දින දීය.	ප්‍රමාණවත් සහායක කාර්ය මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශනයන් ලබාදිම ප්‍රමාද වි ඇත. ඉදිරියෙදි මෙම ප්‍රමාදයන් වලක්වා ගැනීමට කටයුතු කරමි.

5.2 සංයුක්ත සැලැසුම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 – 2018 කාල පරිච්ඡේදයට අදාල සංයුක්ත සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති 21 ක් ආරම්භ කර නොතිබුණි.	සැලසුම් ගත ව්‍යාපෘති වලින් වැඩි ප්‍රමාණයක් ආරම්භ කොට ඇති අතර සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රායෝගික අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුවී ඇත.
(ආ) 2003 ජුනි 02 දිනැති අංක පී.ජී.ඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගතව නොතිබුණු අතර ඉටුකරගත යුතු ඉලක්කයන්ගේ මූල්‍ය අගයන් දක්වා නොතිබුණු බැවින් ප්‍රගතිය ඇගයිමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.	අදාල සැලසුම් යාවත්කාලීන කිරීමේදි මෙම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමි.

5.3 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම සම්බන්ධයෙන් සිදුකල පරික්ෂාවේදී 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය අනුව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට යාවත්කාලින කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් වී නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරමි.
(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ භෞතික ප්‍රගතිය මැන බැලීම සඳහා කාර්ය සාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරමි.
(ඇ) සංයුක්ත සැලැස්මේ හා ක්‍රියාකාරි සැලැස්මේ භෞතික ප්‍රගතිය මැන බැලීම හා ඊට අදාල තීරණ ගැනිම සඳහා උපායමාර්ගික කළමනාකරණ හා සංවර්ධන කමිටුවක් පිහිටුවා තිබු නමුත් එම කමිටුව මාස්පතා රැස්වී ප්‍රගති සමාලෝචනයක් කර නොතිබුණි.	සැලැසුම් ගත පරිදි රැස්වීම් පැවැත්වීමට කටයුතු කරමි.

5.4 විගණන හා කළමනාකරණ කමිටු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 15 ඡේදය ප්‍රකාරව වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.	නියමිත පරිදි ඉදිරි කටයුතු සිදු කරනු ඇත.
(ආ) දැනට මිලදීගෙන ඇති පරිගණකගත ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීනව ක්‍රියාත්මක කිරිම, අනධ්‍යයන කාර්යමණ්ඩලයේ සියළු නිලධාරින් වෙත රාජකාරි පැවරිමේ ලිපි නිකුත් කිරිම, විගණන විමසුම් ලේඛනය නඩත්තු කිරිම සහ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දිම සම්බන්ධයෙන් 32 වැනි විගණන කමිටුවේදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයක් නිරික්ෂණය විය.	මෙම පරිගණක මෘදුකාංගය මිලදි ගත් ආයතනය වෙත මෙය යාවත්කාලීනව පවත්වා ගෙන යාම සඳහා මෙහි ඇති අඩුපාඩු සකස් කර දෙන ලෙස මේ වන විට දැනුම් දි ඇත. රාජකාරි පැවරීමේ ලිපි ලබා දි නොමැති නිලධාරින් සඳහා ඉදිරියේදි ලබා දීමට කටයුතු කරමි.විගණන විමසුම් ලේඛනයක් නඩත්තු කරන අතර ඉදිරියේදි එය යාවත්කාලීන කිරීමට කටයුතු කරමි.

5.5 ප්‍රසම්පාදන සැලැස්ම
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය සතුව වෙබ් පිටුවක් හා ප්‍රමාණවත් තොරතුරු තාක්ෂණ පහසුකම් ඇති නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.8 මාර්ගෝපදේශය ප්‍රකාරව විද්‍යුත් ප්‍රසම්පාදන කටයුතු විද්‍යුත් මාර්ගයෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.	ප්‍රසම්පාදන කටයුතු විද්‍යුත් මාර්ගයෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනිමි.

5.6 අයවැය ලේඛනමය පාලනය

(අ) ඇස්තමේන්තුගත වියදම්, තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී පුනරාවර්තන වැය විෂයයන් 05ක් සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 13 සිට සියයට 61 දක්වා වූ විචලනයක් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 07 ක් සඳහා වෙන්කර තිබුණ ප්‍රතිපාදන වලින් සියයට 15 සිට සියයට 91 දක්වා වූ සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.	2014 අවසාන කාර්තුවේ පුනරාවර්ථන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන නිදහස් නොකිරීම මෙම විචලනයට හේතු වී ඇත.
(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් සේවක සංවර්ධන ආයතනය හා උපාධි ලෝගු මිලදී ගැනීම සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන අනුමත කර ගැනීමකින් තොරව පිළිවෙලින් රු. 2,782,153 ක් හා රු. 94,500 ක් වියදම් දරා තිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මඟින් විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන සඳහා දෙන ලද අතිරේක ප්‍රතිපාදන මඟින් මෙම මිලදී ගැනීම් සිදු කර ඇත.

5.7 නොවිසඳි ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

2012 සැප්තැම්බර් 21 දින පැවැති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදුන් උපදෙස් අනුව අපජලය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීමට මේ දක්වා විශ්ව විද්‍යාලය අපොහොසත්ව තිබුණි.	මේ වන විට අපජලය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කිරීමට අදාල සියලුම වැඩ කටයුතු ආරම්භ කර ඇත.